නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශය

திறன் அபிவிருத்தி, தொழிற்சார் கல்வி, ஆராய்ச்சி மற்றும் புதிய கண்டுபிடிப்புக்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Skill Development Vocational Education Research and Innovation





වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

2022

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

இலங்கை தொழிற்பயிற்சி அதிகாரசபை

Vocational Training Authority of Sri Lanka



ආයතනය	-	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
අමාත්‍යාංශය	-	අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය
ලිපිනය	-	නිපුණතා පියස, නො 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
ඊ මේල් ලිපිනය	-	info@vtasl.gov.lk
වෙබ් අඩවිය	-	www.vtasl.gov.lk
විගණකවරු	-	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවන්	-	මහජන බැංකුව

පටුන

දැක්ම හා මෙහෙවර	03
කාර්යයන්	04
පිළිගැන්වීම	05
හැඳින්වීම හා ව්‍යුහය	06
අධ්‍යක්ෂ මණ්ඩලය	06-07
මෙහෙයුම් කාර්යභාරය	08-09
ආයතනය පසුකල සන්ධිස්ථාන	10-11
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	12
2022 වසරේ ජයග්‍රහණයන්	12-14
2023 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක	15-16
ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය	17-19
කාර්යය මණ්ඩල සංයුතිය	20-23
වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට	
වෘත්තීය පුහුණුව ලබාදීම	24-27
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය	28-30
වෘත්තීය පුහුණු පර්යේෂණ පැවැත්වීම හා ඇගයීම	31
වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය	32
රැකියාගත කිරීම	33-35
රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්	36
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	37
අභියෝග	37
විගණන හා කළමනාකරණ කමිටු කාර්ය සාධනය	38-40
මූල්‍ය වාර්තාව	41-75
විගණකාධිපති වාර්තාව	76-85
විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු වාර්තාව	86-91

දැක්ම

ගෝලීය රැකියා වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලන

ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා නිර්මාණශීලී වෘත්තීය පුහුණුව සපයන

ප්‍රමුඛතම ආයතනය වීම



මෙහෙවර



වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා තාක්ෂණයන් මඟින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින් ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම.

අපගේ සේවාවන් හා පහසුකම් ඉහළම ප්‍රමිතියක

තබා ගනිමින් හා ජාත්‍යන්තර රැකියා ප්‍රවණතාවයන්

ඉලක්ක කර ගනිමින් අපි මෙම

මෙහෙවර සාක්ෂාත් කර ගන්නෙමු.

කාර්යයන්

01 වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියා ගතවීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබාගත හැකිවන පරිදි සුදුසුකම් ඇති තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුවක් සෘජුවම හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආයතනයක් මඟින් ලබාදීම.

02 ජාතික වෘත්තීය පරීක්ෂණ, විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයන්ට සහතික සහ වෙනත් ප්‍රධාන නිකුත් කිරීම.

03 වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවත්වීම හා වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම.

04 වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිසි ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා එම මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

05 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සපයන ලද පහසුකම් සහ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් නියම කිරීම සහ අය කිරීම.

06 අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම , දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, කුලියට ගැනීම හෝ බැහැර කිරීම.

07 අධිකාරියේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම ගිවිසුම් වලට එලඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

08 අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේවායෝජකයින් සමඟ ගිවිසුම් වලට එලඹීම.

09 අධිකාරියේ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදහස් කරනු ලබන සෑම සේවායෝජකයෙකුම එම පුහුණුවට ප්‍රථම ආධුනිකයා සමඟ ගිවිසුමකට එලඹිය යුතු බවට සහ එම ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වග බලා ගැනීම.

10 වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබාදීම.

පිළිගැන්වීම

ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා,
අධ්‍යාපන අමාත්‍ය,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව 2022
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට ,
විශ්වාසී ,

වියාර් වයිස් මාෂර්ල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී .

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයින් 12 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය (2022.10.09 සිට 2022.12.31 දක්වා)

- **ඒ.ටී. උපාලි කැප්පිටිපොල මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **රුවිනි ධර්මසිරි මෙනවිය**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තුමේන්තුව
- **රුවික අමරසේකර මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය
- **යූ.එන්.මල්ලවආරච්චි මහතා**
  අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
  මුදල් ආර්ථික කටයුතු හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
  (2022.12.23 දක්වා)
- **ආර් .ඒ.එල්.උදය කුමාර මහතා**
  අධ්‍යක්ෂ
  රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
  (2022.12.23 සිට)
- **සමන් ඩී වඩුගේ මහතා**
  අතිරේක ලේකම්
  ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
  (2022.12.18 දක්වා)
- **බී.ඒ.කේ.ඩබ්.එල්.ප්‍රියන්ත මහතා**
  අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන)
  කර්මාන්ත සහ සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශය (2022.12.18 දක්වා)
- **හඳා විතානගේ මිය**
  අධ්‍යක්ෂ
  අධ්‍යාපන අමාත්‍යාංශය (2022.12.19 දක්වා)
- **ඉනේන්ද්‍ර මංජුල ගුණරත්න මහතා**
  හිටපු නියෝජ්‍ය ප්‍රධාන විධායක
  සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී
- **එස්. ජී ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා**
  හිටපු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ
  ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම
- **කනිෂ්ක තිලකරත්න මහතා**
  සභාපති
  KWAG හෝල්ඩින්ස් පුද්ගලික සමාගම
- **කේ . පී. මනුගම මහතා**
  අධ්‍යක්ෂ
  අධ්‍යාපන අමාත්‍යාංශය
- **චතුර ද සිල්වා මහතා**
- **ජේ .එම්. සනත් බණ්ඩාර ජයසුන්දර මහතා**
  Consultant and Corporate Sectretaries
  පුද්ගලික සමාගම

2022 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇත

අධ්‍යක්ෂ මණ්ඩලය
(2022.01.01 සිට 2022.10.05)

- **චරංග බස්නායක මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **මහේෂ් ආරියරත්න මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- **තරංග නලින් ගම්ලත් මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

- **ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තුමේන්තුව

- **ටී එම් ජේ බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ
  මුදල් ආර්ථික කටයුතු හා ප්‍රතිපත්ති
  සංවර්ධන අමාත්‍යාංශය

- **පියදාස එච් මාරම්භගේ මහතා**
  ප්‍රධානී
  ග්‍රීන් ඉංජිනියරින් සහ ටෙක්නොලොජි සමාගම

- **සමන් ඩී. වඩුගේ මහතා**
  අතිරේක ලේකම්
  ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

- **වින්දික පියරත්න මහතා**
  අධ්‍යක්ෂ
  කාර්මික සංවර්ධන කර්මාන්ත හා සැපයුම්දාම
  කළමනාකරණ අමාත්‍යාංශය

- **හඳා විතානගේ මිය**
  අධ්‍යක්ෂ
  අධ්‍යාපන අමාත්‍යාංශය

- **ආචාර්ය මනීෂා බර්තා කොඩිතුවක්කු මිය**
  අධ්‍යක්ෂ - ලීගල්නෙස්ට් පුද්ගලික සමාගම
  බාහිර කථිකාචාර්ය - මොරටුව විශ්වවිද්‍යාලය,
  ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය , SLIDA SLIIT

- **සජීව සුරවීර මහතා**
  සාමාන්‍යාධිකාරී (මානව සම්පත්)
  මැක්ලර්නස් හෝල්ඩින්ග්ස් සමාගම

- **වෛද්‍ය කේ ඒ එච් ඩී කේ කොල්ලුරේ මහතා**



මෙහෙයුම් කාර්යභාරය

පුහුණු අංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රමුඛ අංශය මෙය වන අතර දිවයින පුරා ස්ථාපිත පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කරමින් අධ්‍යනය කාර්යය මණ්ඩලය සහ භෞතික සම්පත් සැකසීම සිදු කරනු ලබේ.මෙම අංශය යටතේ සෘජුව පුහුණුව සඳහා දායක වන 1238 ක (දිස්ත්‍රික්ක ද ඇතුලත්) කාර්යය මණ්ඩලයක් ඇත.

පාලන අංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවාවන් සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් කළමනාකරණය පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර අධිකාරිය සතු රු.බිලියන 7 ක් පමණ වටිනාකමින් භෞතික සම්පත් පවත්වාගෙන යාමත්, යටිතල පහසුකම් කළමනාකරණය මෙමගින් ඉටු වේ. 604 ක කාර්යය මණ්ඩලයක් සේවය කරනු ලැබේ.

පරීක්ෂණ සහ ඇගයීම් අංශය

පරීක්ෂණ සහ ඇගයීම් කටයුතු කිරීම පිළිබඳව අදාල ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සකස් කිරීම, අදාල උපදේශකවරුන්/විභාග පරීක්ෂකවරුන් /කාර්ය මණ්ඩලය පුහුණු කරමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල පවත්වන NVQ, Non NVQ පාඨමාලා සඳහා පෙර ඇගයීම් සහ අවසන් ඇගයීම් සැලසුම් කිරීම, පැවැත්වීම, නියාමනය සහ අධීක්ෂණය කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

වෘත්තීය මාර්ගෝපදේශන හා ප්‍රවර්ධන අංශය

දිවයින පුරා ස්ථානගතව සිටින වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් මගින් වෘත්තීය පුහුණුවට අදාල ප්‍රාදේශීය, දිස්ත්‍රික්, ජාතික මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු සිදු කිරීමත් පුහුණුව සඳහා තරුණ තරුණියන් බඳවා ගැනීම සඳහා වැඩිදුර පුහුණුව සහ රැකියා අවස්ථා සඳහා යොමු කිරීම මෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය

ආයතනික මෙහෙයුම් කාර්යය සඳහා දායකත්වය සපයන අංශයකි.ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය දිගුකාලීන සහ කෙටිකාලීන සැලසුම් සකස් කිරීම සහ ප්‍රගතිය විශ්ලේෂණය කරමින් නව පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය පියවරයන් සැලසුම් කිරීම හා වෘත්තීය පුහුණුවට අදාල විවිධ පර්යේෂණයන්, සිද්ධි අධ්‍යනයන් සිදු කිරීමද නව ව්‍යාපෘතීන් සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.අංශයට අනුයුක්තව ඇති තොරතුරු කළමනාකරණ පද්ධතිය (MIS) කළමනාකරණය කිරීම මඟින් ආයතනික සංවර්ධනය සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණයන් සැපයීමද සිදු කරනු ලබයි.

ගිණුම් අංශය

රජයේ පිළිගත් මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුව වාර්ෂික ඇස්තමේන්තු සහ අවසන් ගිණුම් ප්‍රකාශන පිළියෙල කරමින් ආයතනයේ සියලුම මූල්‍ය කටයුතු හැසිරවීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ආයතනය පසු කල සන්ධිස්ථානයන් 1995-2020

වර්ෂය	සන්ධිස්ථානයන්
1995	■ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කිරීම.
2000	■ නියාගම ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීම. ■ තරුණ තරුණියන් පුහුණු කිරීම සඳහා රැකියාගත අංශයක් පිහිටුවීම. ■ GIZ ආධාර මත වෘත්තීය පුහුණු අධිකාරියේ නිලධාරීන් වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් ලෙස පුහුණු කිරීම.
2005	■ සුනාමි ව්‍යවසන අවස්ථාවේ දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සුනාමියට ගොදුරු වූ ප්‍රදේශ වල විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් ජංගම සනීපාරක්ෂක පහසුකම් සලසමින් විශාල දායකත්වයක් දැක්වීම. ■ CEFE, SDP, ILO, CCF ව්‍යාපෘතීන්හි සහයෝගීතාවයෙන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම.
2010	■ ආබාධිත (Disable) තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමු කරවීමේ අරමුණින් නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ ඔවුන් සඳහා පාඨමාලා 3 ක් ආරම්භ කිරීම තුලින් ආබාධිත තරුණ තරුණියන්ට නව පැතිකඩක් විවෘත කර දීම. ■ කොරියන් ආධාර මත ඉදිකල නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය ආරම්භ කිරීම.
2015	■ ඩිප්ලෝමාධාරීන් සඳහා සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය ආරම්භ කිරීම (2017) ■ කොරියන් ආධාර මත ඉදිකල ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනය ආරම්භ කිරීම .(2018) ■ BMICH හි පැවති EDEX රැකියා වෙළඳපල හා ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය නියෝජනය කරමින් වෘත්තීය මාර්ගෝපදේශ අංශය ඉදිරිපත් කල ප්‍රදර්ශන කුටියට Best Social Impact Stall සම්මානය දිනා ගැනීමට හැකි වීම. ■ ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුහුණු මධ්‍යස්ථාන 12 ක් සංවර්ධනය කිරීම.
2020	■ ඩිජිටල් රූපවාහිනී නාලිකාව ආරම්භ කිරීම (Skill TV – You Tube) සහ වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා නව වෙබ් අඩවිය සමඟින් Mobile App හඳුන්වා දීම. ■ නියමු වැඩසටහන් ව්‍යාපෘතියක් ලෙස නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ Smart Class room ස්ථාපිත කිරීම. ■ "Hotel School – අහංගම" වෘත්තීය පුහුණු අධිකාරිය සතු කර ගැනීම



1995 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කිරීම.



කොරියන් ආධාර මත ආරම්භ කරන ලද ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනය - 2018



Smart Classroom භාවිතා කර අධ්‍යනය කටයුතු සිදු කිරීම.



කොරියන් ආධාර මත ඉදි කල නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනය



"Hotel School – අහංගම" වෘත්තීය පුහුණු අධිකාරිය සතු කර ගැනීම



ඩිප්ලෝමාධාරීන් සඳහා සහතිකපත්‍ර ප්‍රධානය කිරීම

සමාජ සත්කාරක සේවාවන්හි යෙදීම



සුනාමි ව්‍යවසනයෙන් අවතැන් වූවන් සඳහා සහනාධාර ලබා දීම.



කොවිඩ් වසංගතයට ලක් වූ රෝගීන් සදහා අවශ්‍ය ඇඳවල් සකස් කර දීම

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවනු ලැබිය. 2022 වර්ෂයේ දී ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 179 ක් හා ලියාපදිංචි වූ බන්ධනාගාර හා පුනරුත්ථාපන මධ්‍යාස්ථාන 03 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 212ක මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් 1583ක් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 368 ක් පවත්වා යෞවන යෞවනියන් 34999 කට තම සේවය සැපයීමට සමත් විය.

2022 වසරේ ජයග්‍රහණයන්

1. 2022 වර්ෂයේ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 212 ක දී පූර්ණකාලීනව හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් පිළිවෙලින් 27688 ක් හා 7311 ක් වශයෙන් 34999 ක් බඳවා ගැනීමට කටයුතු කිරීමට හැකි විය. එය සමස්ත බඳවා ගැනීමෙන් 83% ක ප්‍රතිශතයක් වන අතර පාඨමාලා 120 ක් උපදේශකවරුන් බඳවා ගැනීමට නොහැකි වීම මත ආරම්භ කිරීමට නොහැකි විය.
2. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 17,734 කුත් (NVQ) නොවන සහතික 2,356 කුත්, පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 3,006 කුත් වශයෙන් සහතික 23,096 ක් නිකුත් කිරීම.
3. 2022 වර්ෂය තුල වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 1779 ක් පවත්වා පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් ඇතුලු 88,140 ක් දැනුවත් කිරීම.
4. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) Level 05 සහ 06 ඩිප්ලෝමාධාරීන් 353 ක් සඳහා 3 වන වරට බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සහතිකපත්‍ර ප්‍රදානය කිරීම.
5. අතුරු අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.
    - ක්ෂුද්‍ර පරිමාණ ස්වයං රැකියා /ජීවනෝපාය වෘත්තීන්හි යෙදී සිටින ප්‍රජාවගේ රැකියා සුරක්ෂිතතාව සහතික කිරීමට පවත්වන විශේෂ පුහුණු වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21 ක කෙටිකාලීන පුහුණු වැඩසටහන් 37 ක් මගින් 612 දෙනෙකු පුහුණු කිරීම.
    - පෙර දැනුම් පාදක කර ගත් (RPL) ඇගයීම් ක්‍රමවේදය යටතේ සහතිකපත්‍ර 619 ක් ලබා දීම.
6. වෘත්තීය පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා නව තාක්ෂණය යොදාගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගත වීම.
    - ILO ව්‍යාපෘති ආධාර යටතේ ජපන් පාඨමාලා 6 ක් සහ වැඩිහිටි රැකවරණ පාඨමාලා 6 ක් ආරම්භ කර පිළිවෙලින් 525 දෙනෙකු හා 170 දෙනෙකු පුහුණු කිරීම.ඊට අමතරව පාඨමාලා 27 ක් යටතේ පෙර දැනුම් ඇගයීම (RPL) 653 ක් සඳහා සහතික ලබා දීම.
    - S4IG (Skills for Inclusive growth) මෙම ව්‍යාපෘතිය යටතේ සූපවේදී පාඨමාලා වෘත්තීය සූපවේදී පාඨමාලා ලෙස සංවර්ධනය කිරීමට පහත අයුරින් දායක වී ඇත.
        - කඳුරුවෙල සහ අහංගම සූපවේදී ප්‍රායෝගික වැඩහල් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.
        - සූපවේදී උපදේශකවරුන් 40 ක් පුහුණු කිරීම.
        - ඉංග්‍රීසි උපදේශකවරුන් 21 දෙනෙකු ක්ෂේත්‍රයේ භාවිත ඉංග්‍රීසි පිළිබඳව පුහුණුව ලබා දීම.
        - කඳුරුවෙල අහංගම අබේගොඩ හා කුච්චවේලි ක්‍රියාත්මක වන සූපවේදී පාඨමාලා 4 ක් සඳහා අනුග්‍රහය දැක්වීම.

- Supreme Chef වැඩසටහන සඳහා ආධුනිකයින් 20 ක් යොමු කිරීම, ඉන් තරඟාවලියේ අවසන් වටය සඳහා 12 දෙනෙකු සුදුසුකම් ලැබීම සහ ඉන් 1 ස්ථානය හා 4 වන ස්ථානය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සතුවීම . ඊට අමතරව ආධුනිකාවන් 6 දෙනෙකුට සම්බන්ධපදබ හෝටලයේ රැකියා අවස්ථා හිමිවීම.

- TANTRI ආයතනය සමඟ එක්ව පෑස්සුම් ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් නිපුණ කාර්මිකයින් බවට පත් කිරීම සඳහා රැකියා පුහුණුව තුළින් දැනුම කුසලතා වර්ධනය කිරීම, පුහුණුලාභීන් 22 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- ජාතික යොවුන් සේනාංකය සමඟ එක්ව ජෝර්දානය ඇඟලුම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා ලබා දීමට සංවිධානය කිරීම. පුහුණුලාභීන් 78 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- ලීමා ක්‍රියේෂන් පෞද්ගලික සමාගම සමඟ එක්ව වඩු කාර්මික ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් සඳහා රැකියා පුහුණුව තුලින් නිවැරදිව දැනුම සහ කුසලතා ලබා දීමෙන් වෘත්තීය කාර්මික ශිල්පීන් බවට පත් කිරීම. පුහුණුලාභීන් 20 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- Gamma Pizzakraft පෞද්ගලික සමාගම් සමඟ එක්ව එහි සේවකයින් සඳහා RPL ක්‍රමවේදය සම්බන්ධීකරණය කිරීම.මේ වන RPL 43 ක් සිදු කර ඇත.
- Synex ජාත්‍යන්තර පෞද්ගලික සමාගම සමඟ එක්ව රැකියාගත පුහුණුව තුළින් පහලයාගොඩ මධ්‍යස්ථානයේ විදුලි කාර්මික ක්ෂේත්‍රයේ පුහුණුවන්නන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම. පුහුණුලාභීන් 35 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- Printcare Universal Private Limited සමඟ එක්ව මුද්‍රණ ඇසුරුම් ක්ෂේත්‍රයේ නිපුණ වෘත්තිකයින් බිහි කිරීම සඳහා දැනුම සහ කුසලතා වර්ධනය කිරීම. පුහුණුලාභීන් 24 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- Cinnamon Hotels and Resort සමඟ එක්ව කුරුඳු සහ හෝටල් ආශ්‍රිත සේවකයින් සඳහා RPL ක්‍රමවේදය හඳුන්වා දීම.මේ වන විට පෙර ඇගයීම් 7 ක් සිදු කර ඇත.
- රේන්බෝ ලංකා පුහුණු ආයතනය සමඟ එක්ව VTA පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුවන්නන් රැකියාගත කිරීමේ අරමුණින් ජපන් භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ ව නිපුණතාවයක් ලබා දීමට ගිවිසුම්ගත වීම.
- Sterling Automobile Lanka (Pvt) Ltd සමඟ එක්ව මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් හට වෘත්තිය පුහුණුව ලබා ගැනීම. උපදේශකවරුන් 30 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- R- Pac Printcare Lanka (Private) Ltd සමඟ එක්ව තිර මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය තුලින් ඔවුන් මුද්‍රණ සහ ඇසුරුම් ක්ෂේත්‍රයේ නිපුණ වෘත්තිකයින් බවට පත් කිරීම. පුහුණුලාභීන් 15 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- ත්‍රිකුණාමලය, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක වල අවධානමට ලක් විය හැකි කණ්ඩායම් සඳහා Child Fund ආයතනය සමඟ එක්ව රැකියා උත්පාදනය සඳහා නව පාඨමාලා තුනක් ආරම්භ කිරීම.ආධුනිකයින් 16 දෙනෙකු මේ වන විට ප්‍රතිලාභ ලබා ඇත.
- Swiss Hotel Management Academy (PVT) Ltd ආයතනය සමඟ එක්ව VTA සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව, ගුරුවරුන් සඳහා වැඩිදුර පුහුණුව සහ දැනුම ලබා දීමට ගිවිසුම්ගත වීම.

7. පුහුණුව කාර්යක්ෂම කිරීම සඳහා මෘදුකාංග

- පාඨමාලා වෙත පුහුණු ද්‍රව්‍ය ලබා දීමේ ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයේ සිට අධීක්ෂණය කිරීම සඳහා System Develop කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

8. ශ්‍රී ලංකාව තුල පැවති Covid ව්‍යවසනය හමුවේ පුහුණුවන්නන්ගේ රැකියාගත පුහුණුවට අදාළව රෝහල් ඇඳන් 500 ක් සකස් කර රෝහල් වෙත පරිත්‍යාග කිරීම.

9. ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ රූපවාහිනී නාලිකාව (V TV - Youtube) මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා 11 ක් සඳහා Video Clips 157 ක් නිෂ්පාදනය කිරීම හා වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 78 ක් පැවැත්වීම මඟින් දෙමාපියන් , පාසල් දරුවන් , ගුරුවරුන් 5950 දැනුවත් කිරීම.

10. කොමර්ෂල් බැංකුවේ සමාජ සත්කාර වැඩසටහන යටතේ අලුතින් හදුන්වා දුන් ඇගලුම් නිර්මාණ තාක්ෂණ ශිල්පී පාඨමාලා 15 ක පුහුණුවේ ගුණාත්මකභාවය වැඩිකර ගැනීම සඳහා පරිගණක යන්ත්‍ර 15 ක් ලබා දීම.

11. පීපල්ස් ලීසිං සමාගමේ සමාජ සත්කාරක වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක වන මෝටර් කාර්මික ශිල්පීන් NVQ Level 3 හි හඳුනා ගන්නා ලද ආධුනිකයින් 35 කට NVQ Level 4 ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

2023 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

පවත්නා ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ 2023 වසර අර්ධ රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අභියෝගාත්මක වසරක් වේ. පවත්නා ආර්ථික තත්ත්වයන්ට උචිත ශ්‍රම බලකායක් විශේෂයෙන් විදේශීය රැකියා අවස්ථා ඉලක්ක කර ගනිමින් ඉතා කඩිනම් පුහුණු අවස්ථාවන් සැලසීමට කටයුතු සැලසුම් කරනු ඇත.

1. වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 18 ක් යටතේ ජාතික ශ්‍රම බලකායට උචිත කුසලතා පූර්ණ තරුණ පරපුරක් දායාද කිරීමේ අරමුණින් දිවයින පුරා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 2,962 ක් පැවැත්වීම මඟින් පිලිවෙලින් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 33,990 ක් හා 8,745 ක් ලෙස ආධුනිකයින් 42,735 දෙනෙකු පුහුණු කිරීම. ඊට අමතරව තරුණ ඉල්ලුමට සරිලන කෙටිකාලීන පුහුණු වැඩසටහන් දියත් කිරීමට සැලසුම් කෙරේ.
2. 2023 වර්ෂයේ සිට තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන 67 ක පාඨමාලා 49 ක් සඳහා පාඨමාලා ගාස්තු අය කිරීමට කටයුතු කරනු ඇත.
3. විධිමත් ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් NVQ ඇගයීම් 25,000 ක් සහ NVQ නොවන ඇගයීම් 1,650 ක් ද RPL 4000 ක් වශයෙන් ඇගයීම් පැවැත්වීමට කටයුතු කිරීම.
4. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 50 ක් පැවැත්වීම .
5. රාජ්‍ය හා පෞද්ගලික සම්බන්ධතා (PPP) මත පවත්වනු ලබන ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් 44 ක් පැවැත්වීමඟ
6. රැකියා වෙළඳපොළ පැවැත්වීම හා කර්මාන්ත ලියාපදිංචි කර ගැනීම තුලින් පුහුණුව අවසන් කරන ආධුනිකයින්ට දේශීය රැකියා හා ස්වයං රැකියා අවස්ථා පිළිවෙලින් 8,075 ක් හා 1,100 ක් වශයෙන් රැකියා 9,175 ක් ලබා දීම.
7. වඩාත් ගුණාත්මක වෘත්තීය පුහුණුවක් සඳහා කර්මාන්ත චාරිකා 230 ක් සහ රැකියා වෙළඳපල 20 ක් පැවැත්වීම මඟින් පුහුණුවන්නන් සාර්ථකව රැකියාගත කිරීමට සැලසුම් කිරීම.
8. පාසැල් ළමුන් හා පාසැල් හැරගිය තරුණ තරුණියන්ගේ ඉදිරිමඟ සැලසුම් කර දීම සඳහා You lead ආයතනය සමඟ ඒකාබද්ධව වෘත්තීය මාර්ගෝපදේශන ජංගම බස්රථ (Career Bus) වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කිරීම.
9. පුහුණු පරිසරය හා පුහුණු පාඨමාලා පිළිබඳව අවබෝධයක් ලබා දීම අරමුණු කර ගනිමින් පාසැල් සිසුන් සඳහා විවෘත දිනයන් දහයක් (Open days) පැවැත්වීමට සැලසුම් කිරීම.
10. NVQ Level 3/4 සහතිකපත්ලාභීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ද NVQ Level 05 ඩිප්ලෝමාධාරීන් සඳහා ජාතික මට්ටමින්ද සහතික ප්‍රදානෝත්සවයන් පැවැත්වීමට සැලසුම් කිරීම.
11. අන්තර්ජාලය හරහා අධ්‍යයන කටයුතු කිරීමට පහසු වන පරිදි NVQ විෂය ධාරාවේ පාඨමාලා 70 ක් ආවරණය වන පරිදි VTA Youtube නාලිකාව මඟින් Video Uploading ක්‍රියාවලිය සිදු කිරීම.
12. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුව ලබා සාර්ථක වූ දේශීය හා විදේශීය වශයෙන් රැකියාගතවූවන් සහ ව්‍යවසායකයින් පාදක කර ගනිමින් Success Story 10 ක් නිර්මාණය කිරීම.
13. ICT Level V පාඨමාලාවේ විෂය නිර්දේශ කර්මාන්ත ක්ෂේත්‍රයට ගැළපෙන පරිදි යාවත්කාලීන කර ක්‍රියාත්මක කිරීම.
14. වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුල නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හදුනා ගැනීමේ අරමුණින් කර්මාන්තහිමියන් දැනුවත් කිරීමේ වැඩමුලු 13 ක් පැවැත්වීම.
15. කාර්යය මණ්ඩල සංවර්ධනය යටතේ අධ්‍යයන කාර්යය මණ්ඩලය 940 දෙනෙකු සමඟින් අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරීම.

16. PPP යටතේ 2023 වර්ෂයේ ගිවිසුම්ගත වීමට පවතින රාජ්‍ය සහ පෞද්ගලික ආයතන

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ පුහුණු ආයතනය
- ගැමා පීසා ක්‍රාෆ්ට් පුද්ගලික සමාගම සහ සේවාලංකා පදනම
- ස්විස් ටෙක් ඇලුමිනියම්
- ලයා බීච් - වාද්දූව
- ඩිල් ෆිල්මිස් ජාත්‍යන්තර පුද්ගලික සමාගම
- ආදිත්‍යා ආයුර්වේද පුද්ගලික සමාගම



එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

සභාපති

ඒ .ටී. උපාලි කැප්පිටිපොල මහතා - 2022.10.06 සිට මේ දක්වා
වීරංග බස්නායක මහතා - 2021.04.08 සිට 2022.10.05 දක්වා

උප සභාපති

රුවිනි ධර්මසිරි මෙනවිය - 2022.10.06 සිට මේ දක්වා
මහේෂ් ආරියරත්න මහතා - 2021.05.10 සිට 2022.10.05 දක්වා

අධ්‍යක්ෂ ජනරාල්

එච්. චූලාංගනී පෙරේරා මිය

අධ්‍යක්ෂවරු

1. පී.වී.පී.නිරෝෂන පෙරේරා මහතා (මානව සම්පත් හා පරිපාලන) (2022.03.03 සිට 2022.12.31 දක්වා)
2. යු.කේ. නන්ද මහතා (පරීක්ෂණ හා ඇගයීම්) - 2022.12.31 සිට විශ්‍රාම ගොස් ඇත.
3. එස්.එම්. එදිරිසිංහ මිය (පුහුණු)
4. පී.එච්.පී.දමයන්ති මිය (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) 2022.05.23 සිට රාජකාරී ඉටු කිරීම.
5. ජේ. ඒ.ඩී.එස්.නිශාමනී මිය (මුදල්) (2019.12.19 සිට වැඩ බැලීම)
6. සී.ජේ.විද්‍යානපතිරණ මහතා (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් හා ප්‍රවර්ධන) (2021.09.29 සිට වැඩ බැලීම)
7. එම්.ඒ.නපීඩ් අහමඩ් මහතා (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන 2020.05.21 සිට 2022.05.22 දක්වා ද්විතීයික පදනම මත)
8. ඩබ්.ඒ. රණවීර මහතා (මානව සම්පත් හා පරිපාලන) - 2022.03.02 සිට විශ්‍රාම ගොස් ඇත.

ප්‍රධාන අභ්‍යන්තර විගණක

1. ජේ.එම්.පී.සිරිවර්ධන මිය (වැඩ බැලීම) - 2022.03.02 දින සිට මේ දක්වා
2. එල්.එන්.ජී.එස්. කුමාර මහතා (රාජකාරී ඉටු කිරීම) - (2021.11.17 සිට 2022.03.01 දක්වා)

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

1. ඊ.වී.ඩී.වීස් සේනාරත්න මහතා
2. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
3. ඩබ්.ජී. විජේරත්න මහතා (2022.10.05 දින සිට විශ්‍රාම)
4. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා
5. වී. කනගසුන්දරම් මහතා
6. ටී. විනෝදරාජා මහතා
7. පී.එන්. අබේසිංහ මහතා
8. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා
9. ආර්.එම්.ආර්.රත්නායක මහතා (2022.09.30 සිට සේවයෙන් ඉල්ලා අස් විය)
10. බී.එච්.ඒ. නෙල්සන් මහතා
11. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
12. එම්.ජී.ජී. සමන් මහතා
13. ආර්. සුනිල් මහතා
14. එන්.එම්.වී.කේ. හේරත් මිය (2022.10.25 සිට සේවයෙන් ඉල්ලා අස් විය)
15. එම්.කේ.බී. ජයතිලක මහතා
16. වී.ජී. නිමල්සිරි මහතා
17. එස්. මැද්දේගොඩ මහතා
18. එම්.බී. නලීම් මහතා
19. ආර්. පතිරගේ මිය
20. ඒ.ඒ.ජබීර් මහතා
21. ජී.එල්.ඒ.පීරිස් මහතා (2022.09.30 දින සිට විශ්‍රාම)
22. කේ.ඩී .එන්. ද සිල්වා මහතා
23. පී.පේ. ජයවර්ධන මිය
24. ඩබ්ලිව්.එම්.ඒ.එස්.එල්.විජේනායක මිය.

සහකාර අධ්‍යක්ෂවරු

1. රාධ ක්‍රිෂ්ණන් මධුරතන් මහතා
2. කේ. නිරංජන් මහතා
3. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා
4. පී.ජී. ප්‍රසන්න මහතා
5. එච්. එදිරිසිංහ මිය
6. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
7. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
8. ය.ජී.පෙ.ප්‍රියදර්ශන මහතා
9. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
10. ඊ.පේ. විජේතුංග මහතා
11. එච්.එල්. සිසිර මහතා
12. ඩබ්ලිව්.කේ. සුමිත් වසන්ත මහතා
13. ආර්. අහිලන් මහතා
14. එච්.ටී.ඩී.ආර්.එස්. විජේසිංහ මහතා
    2022.06.21 සිට විශ්‍රාම ගොස් ඇත)
15. තිළිණ රණසිංහ මහතා
16. ජී.ඩී. ශ්‍යාමලී මිය
17. සී. ඩී. සමරනායක මහතා
18. සී.ය.එම්. කොඩිතුවක්කු මිය
19. සුනිල් අබේසිංහ මහතා
20. ජී.කෙ.ඩී.සී. කුමාර මහතා
21. එස්.එම්.පේ. සුවේන්ද්‍ර මහතා
22. එස.එම්.එම්.කේ. සියමුදලි මිය
23. එන.කේ. අඹගහවත්ත මිය
24. ඩී.සී.ඕ. විතාන මිය
25. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
26. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
27. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
28. ඩී.එම්. යහම්පත් මහතා
29. කේ.පී.ඩී.පී. සිරිසේන මහතා
30. එන්.ඒ.ඒ.ඩී. නාගහවත්ත මහතා
31. එම්.එම්.එන්.බී.මධුරසිංහ මහතා
32. එන්.ඩී.ඩී.එදිරිසිංහ මිය
33. එන්.ටී.දළුවත්ත මිය
34. කේ.එස්.ජී.එස්.ගුණසේකර මහතා
35. එම්.ඩී.ඒ.එම්.අමරසිංහ මිය
36. ටී.එම්.ඒ.තෙන්නකෝන් මහතා
37. අයි.යූ .වික්‍රමනායක මිය
38. කේ.ඩී.පී. කුමාර මහතා
    (2022.08.04 සිට ඉල්ලා අස් වී ඇත)
39. එච්.ඒ.ඩී.ආර්. ජයරත්න මහතා
40. එච්.ඩබ්.ආර්.එස් ජයවර්ධන මහතා
41. ඒ.කේ.ජයවර්ධන මිය
42. එන්.ජී.ඩී.අයි.ගුණරත්න මහතා
43. කේ.ඩබ්.රංජිත් ලාල් මහතා
44. එස්.එම්.එස්.බී. සමරකෝන් මහතා
45. එස්.ඒ.ඒ.එස්. අතුකෝරල මහතා
46. කේ.ජී. භාතිය අමරනාථ මහතා
47. අයි.එම්.එන්. දිසානායක මහතා
48. බී.ජී.ඩී.කේ. කාරියවසම් මිය
49. කේ.කේ. සෝගීස්මන් මහතා
50. පී.එන්. රණවීර මහතා
51. කේ. අභිඥාදනා මිය

නීති නිලධාරී

1. ඩී.ඒ.එස්. ආලෝකා ද සිල්වා මිය

කාර්යය මණ්ඩල සංයුතිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2022.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1843 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2022 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2656 කි.

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය	සේවා කාණ්ඩය
01	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0	HM 2-1
02	අධ්‍යක්ෂ	6	2	4	HM1-1
03	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	0	1	
04	කළමනාකාර	1	0	1	MM 1-3
05	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	85	71	14	MM 1-1
06	සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	1	1	0	
07	සහකාර අධ්‍යක්ෂ - අධ්‍යයන	3	0	3	
08	සහකාර අධ්‍යක්ෂ - කාර්මික	1	0	1	
09	සහකාර ලේඛකාධිකාරී	1	0	1	
10	නීති නිළධාරී	1	1	0	
11	අභ්‍යන්තර විගණක	1	0	1	
12	ඉංජිනේරු	1	0	1	
13	පරිපාලන නිළධාරී	3	2	1	JM 1-1
14	පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී	13	7	6	
15	විමර්ශන නිළධාරී	1	1	0	
16	ප්‍රවාහන නිළධාරී	1	0	1	
17	සැපයුම් නිළධාරී	1	1	0	
18	මුද්‍රණ නිළධාරී	1	0	1	
19	අභ්‍යන්තර විගණන නිළධාරී	3	3	0	
20	පද්ධති විශ්ලේෂක	1	0	1	
21	සුභසාධක නිළධාරී	1	1	0	
22	ගිණුම් නිළධාරී	33	29	5	
23	ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී	10	9	1	

24	පුහුණු නිළධාරී	98	50	48	
25	පර්යේෂණ නිළධාරී	2	1	1	
26	සැළසුම් නිළධාරී	2	1	1	
27	සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර	1	0	1	
28	පෞද්ගලික සහකාර *	7	5	0	
29	භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)	1	0	1	MA 5-2
30	භාෂා පරිවර්තක (සිංහල/දෙමල)	3	0	3	
31	ජ්‍යෙෂ්ඨ උපදේශක	201	116	85	MA 4
32	වැඩසටහන් නිළධාරී	70	59	11	
33	විගණන සහකාර *	3	0	0	
34	සහකාර පුස්තකාලාධිපති	1	0	1	MA 3
35	ව්‍යාපෘති සහකාර *	34	7	0	
36	තාක්ෂණික සහකාර	3	1	2	MA 2-2
37	උපදේශක	1529	1072	457	
38	ක්‍රීඩා උපදේශක	31	0	31	
39	සැලසුම් ශිල්පී	1	0	1	
40	ප්‍රමාණ සමීක්ෂක	2	0	2	
41	කාර්මික නිලධාරී(සිවිල්)	5	0	5	
42	කළමනාකරණ සහකාර	196	186	10	MA 1-2
43	සහකාර උපදේශක (LRUC)*	38	30	0	
44	ඇමුණුම්කරු (මුද්‍රණ)	3	1	2	
45	නිවාඩු නිකේතන භාරකරු	2	0	2	
46	සුපරීක්ෂක (මුද්‍රණ)	1	0	1	
47	සුපරීක්ෂක (ගොඩනැගිලි)	1	0	1	
48	රියදුරු	67	56	11	PL 3
49	ගබඩාකරු *	2	2	0	PL 2
50	මුද්‍රණ සහයක	3	2	1	
51	බැඳුම්කරු (මුද්‍රණ)	2	1	1	
52	යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ)	2	2	0	

53	කාර්යාල සහයක	8	5	3	PL 1
54	මුරකරු *	65	35	0	
55	කම්කරු	101	83	18	
	එකතුව	**2656**	**1843**	**743**	

* දැනට වීම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත. ඔවුන් විශ්‍රාම යාමත් සමග වීම තනතුර අහෝසි වේ.

කාර්යය මණ්ඩල සංයුතිය (සේවා කාණ්ඩය අනුව)

	තනතුර	**අනුමත කාර්යය මණ්ඩලය**	**වසර අවසානය වනවිට කාර්යය මණ්ඩලය**	**වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය**
1	HM 2-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර	08	03	05
2	MM 1-3 කළමනාකාර	01	0	01
3	MM 1-1 කළමනාකාර	94	73	21
4	JM 1-1 කණිෂ්ඨ කළමනාකාර	178	109 (*05)	67
5	MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ /ව්‍යාපෘති නිලධාරීන්	04	0	04
6	MA 4 ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා	274	175 (*0)	96
7	MA 3 ආශ්‍රිත නිලධාරීන්	35	07 (*07)	01
8	MA 2-2 කළමනාකරණ සහකාර-තාක්ෂණ	1571	1073	498
9	MA 1-2 කළමනාකරණ සහකාර- තාක්ෂණ නොවන	241	217 **(*30)**	16
10	PL 3 ප්‍රාථමික ශිල්පී	67	56	11
11	PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී	09	07 (*02)	02
12	PL 1 ප්‍රාථමික ශිල්පී නොවන	174	123(*35)	21
	එකතුව	**2656**	**1843**	**743**

* දැනට වීම තනතුර දරන පුද්ගලයින්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත. ඔවුන් විශ්‍රාම යාමත් සමග වීම තනතුර අහෝසි වේ.


කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය වාර්ෂිකවම සිදුකරනු ලබන අතර ඒ සඳහා 2022 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සදහා රු. මිලියන 12 ක් වෙන් කරනු ලැබූ අතර පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක විය.

2022 වර්ෂයේ දී පහත වර්ගීකරණයක් යටතේ කාර්යය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකිවිය.

	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූ සංඛ්‍යාව
අධ්‍යයන	38	*779
අනධ්‍යයන	3	216

* පුහුණු වැඩසටහනේ ස්වභාවය අනුව එක් උපදේශකවරයෙකු වැඩසටහන් කිහිපයකට සහභාගී වී ඇත.



වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2022 වර්ෂයේ පූර්ණකාලීන 1,583 හා අර්ධකාලීන පාඨමාලා 368 කට ඇතුලත් වන පුහුණු වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 34,999 ක් වන අතර 2022.12.31 දිනට ආයතනික පුහුණුව අවසන් කල සංඛ්‍යාව 22,003 කි. ආධුනිකයින් 9,688 ක් 2023 වසරේදි පාඨමාලා අවසන් කිරීමට නියමිතය.

වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම


වර්ෂය	2020	2021	2022
පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව	23,417	33,431	34,999
පුහුණුව අවසන් කල සංඛ්‍යාව	19,346	28,074	22,003

2023 වසරේදි පාඨමාලා අවසන් කිරීමට නියමිත ප්‍රමාණය

පූර්ණකාලීන පාඨමාලා - 5,076
අර්ධකාලීන පාඨමාලා - 4,612
} 9,688

* පුහුණු වැඩසටහනේ ස්වභාවය අනුව එක් උපදේශකවරයෙකු වැඩසටහන් කිහිපයකට සහභාගී වී ඇත.


වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම/පුහුණුව අවසන් කිරීම



පුහුණු පාඨමාලා ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම - 2021

	ක්ෂේත්‍රය	ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව (ආයතනික පුහුණුව)	ප්‍රතිශතය
11	කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත්	190	0.54%
2	මෝටර් රථ අලුත් වැඩියා හා නඩත්තුව	3777	10.79%
3	ගොඩනැගිලි හා ඉදිකිරීම්	2965	8.47%
4	විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ	3749	10.71%
5	ආහාර තාක්ෂණය	1680	4.80%
6	මැණික් හා ස්වර්ණාභරණ	88	0.25%
7	හෝටල් හා සංචාරක	2823	8.07%
8	තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	7427	21.22%
9	සම් ආශ්‍රිත නිෂ්පාදන	53	0.15%
10	ලෝහ හා ලුහු ඉංජිනේරු	1608	4.59%
11	කාර්යාල කළමනාකරණය	181	0.52%
12	දැව ආශ්‍රිත	747	2.13%
13	පුද්ගල හා සමාජ	5083	14.52%
14	මුද්‍රණ හා ඇසුරුම්	80	0.23%
15	ශීතකරණ හා වායුසමීකරණ	653	1.87%
16	රෙදිපිළි හා ඇඟලුම්	3270	9.34%
17	සෞඛ්‍ය හා සමාජ කටයුතු	340	0.97%
18	වෙනත්	285	0.81%
	එකතුව	**34999**	**100.00%**


පුහුණුවට බඳවා ගැනීම -2022



සටහන අනුව සැලකීමේදී වැඩි ආධුනික ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය වන්නේ තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණයය.


ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත රැකියා අවස්ථා බහුල පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ත ඇතුලත් වීමෙන් 46.63% කි.

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව	3680	97	3777	10.79%
ගොඩනැගිලි හා ඉදිකිරීම්	2357	608	2965	8.47%
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	3669	80	3749	10.71%
හෝටල් හා සංචාරක	2326	497	2823	8.07%
දැව ආශ්‍රිත	691	56	747	2.13%
ශීතකරණ හා වායුසමීකරණ	651	2	653	1.87%
ලෝහ සහ ලුහු ඉංජිනේරු	1602	6	1608	4.59%
එකතුව	**14976**	**1346**	**16322**	**46.63%**



සාමාජීය ඉල්ලුම වැඩි හා ස්වයං රැකියා අවස්ථා බහුල පාඨමාලා ක්ෂේත්‍ර

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	2716	4711	7427	21.22%
පුද්ගල හා සමාජ	1348	3735	5083	14.52%
රෙදිපිළි හා ඇඟලුම්	519	2751	3270	9.34%
ආහාර තාක්ෂණය	890	790	1680	4.80%
එකතුව	**5473**	**11987**	**17460**	**49.88%**



සෘජුව රැකියාගත නොවන රැකියා අවස්ථාවන් සඳහා උපකාරී වන පාඨමාලා -2022

පාඨමාලාව (Course)	ඇතුලත් වූ සංඛ්‍යාව (Enrolment)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	2144
පරිගණක දෘඩාංග ශිල්පී - A Plus	775
පරිගණක යෙදවුම් සහයක	1597
පරිගණක දෘඩාංග ශිල්පී	39
එකතුව	**4555**


වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2022 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 02 කත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 01 කත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය.

පුහුණු මධ්‍යස්ථාන	2020	2021	2022
ජාතික වෘත්තීය පුහුණු ආයතනය	08	08	08
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22	22	22
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	181	179	179
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන)	05	04	03
එකතුව	**216**	**213**	**212**

2022 වර්ෂය ආරම්භයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 213ක් ක්‍රියාත්මක වූ අතර කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය බෙල්ලන්විල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කල අතර වටරැක බන්ධනාගාරයේ ක්‍රියාත්මක වූ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වසා දැමීම හේතුවෙන් සමස්ථ මධ්‍යස්ථාන සංඛ්‍යාව 212 ක් විය.

පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය -2022




වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2022

පළාත	දිස්ත්‍රික්කය	ආයතන සංඛ්‍යාව						එකතුව
		NVTI	DVTC	VTC	AT	PC	Reh	
බස්නාහිර	ගම්පහ	-	1	13	3	-	-	14
	කොළඹ	3	1	10	1	-	-	14
	කළුතර	-	1	7	1	-	-	08
වයඹ	පුත්තලම	-	1	6	-	-	-	07
	කුරුණෑගල	-	1	7	-	-	-	08
උතුර	යාපනය	-	1	5	0	-	-	06
	කිලිනොච්චිය	-	1	4	-	-	-	05
	මුලතිව්	-	1	2	-	-	-	03
	මන්නාරම	-	-	1	-	-	-	01
	වව්නියාව	-	1	3	3	-	-	04
නැගෙනහිර	ත්‍රිකුණාමලය	-	1	7	-	-	-	08
	මඩකලපුව	1	-	10	-	-	-	11
	අම්පාර	-	1	12	1	-	-	13
දකුණ	ගාල්ල	2	1	12	3	2	-	15
	මාතර	1	-	12	-	-	-	13
	හම්බන්තොට	1	1	09	-	-	-	11
සබරගමුව	කෑගල්ල	-	1	7	1	1	-	08
	රත්නපුරය	-	1	11	-	-	-	12
ඌව	බදුල්ල	-	1	7	-	1	-	08
	මොණරාගල	-	1	7	-	1[1]	-	09
මධ්‍යම	මහනුවර	-	1	8	-	2	-	09
	මාතලේ	-	1	5	-	-	-	06
	නුවරඑළිය	-	1	4	-	-	-	05
උතුරු මැද	අනුරාධපුර	-	1	7	1	-	-	8
	පොලොන්නරුව	-	1	3	1	[1]	[1]	6
	එකතුව	**8**	**22**	**179**	**15**	**02**	**1**	**212**

NVTI - **ජාතික වෘත්තීය පුහුණු ආයතන**
DVTC - **දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
VTC - **වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
AT - **අනුබද්ධිත**
PC - **බන්ධනාගාර**
Reh - **පුනරුත්ථාපන මධ්‍යස්ථාන**
[ ] - **පුහුණු මධ්‍යස්ථාන ලෙස** TVEC **ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන**

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2022




වෘත්තීය පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුව ලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත්ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 40 කට අධික මුදලක් වැයකරනු ලැබේ. 2022 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය පහත පරිදි වේ.

අංක	වර්ගය	නිකුත් කල සහතිකපත් ප්‍රමාණය
01	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	17,734
02	ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ)	2,356
03	පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL)	3,006
	එකතුව	**23,096**

නිකුත් කල සහතිකපත් ප්‍රමාණය




වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කර්තව්‍යයකි. ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරී මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ඔවුනට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ..

ඉලක්කගත කණ්ඩායම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
පාසැල් සිසුන්	459	24,594
පාසැල් හැරයන්නන්	370	21,245
පුහුණුවන්නන්	399	17,167
දෙමාපියන්	288	12,125
වෙනත්	263	13,009
එකතුව	**1,779**	**88,140**

වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්



රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුවන්නන් වැඩිදුර පුහුණු ව සඳහා යොමු කිරීම, රැකියා අවස්ථා සඳහා යොමු කිරීම හා පවත්නා පාඨමාලා යාවත්කාලීන කිරීම අරමුණු කර ගනිමින් පිහිටවූ කර්මාන්ත සබඳතා අංශය මේ වන විට විවිධ පෞද්ගලික ආයතන හා එක්ව කටයුතු කිරීම අරඹා ඇත.

කර්මාන්ත සබඳතා අංශය විසින් ආයතනික පුහුණුව අවසන් කල පුහුණුලාභීන් වැඩිදුර පුහුණුව සඳහා යොමු කරනු ලබන අතර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මගින් රැකියා ගත කිරීම් කරනු ලැබේ.

එසේ රැකියාගත කිරීම සිදුකරනු ලබන්නේ පාඨමාලාව සාර්ථකව නිමකළ තරුණ තරුණියන් වන අතර පහත වර්ගීකරණයන්ට ලක්වන සියල්ලන් රැකියාගත කිරීමට ලක් නොවේ.


- වෘත්තීය පුහුණු පාඨමාලා හදාරනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්
- බන්ධනාගාර රැඳවියන්
- නැගෙනහිර පළාතේ හා පුත්තලම් දිස්ත්‍රික්කයන්හි පහත පාඨමාලා හදාරනු ලබන පුහුණුලාභීන් ප්‍රතිශතයක් බොහෝ විට තම පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පුහුණුව ලබා ගනු ලැබේ.
    - (a) රූපලාවන්‍ය
    - (b) කොණ්ඩා සැකසුම්
    - (c) සාමාන්‍ය මැහුම්
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 හා 4 හදාරා ඉදිරි NVQ මට්ටම් හැදෑරීමට බලාපොරොත්තු වන ආධුනිකයින් හා උසස් අධ්‍යාපනයට යොමුවන්නන්
- අර්ධකාලීන පාඨමාලා හදාරනු ලබනුයේ රැකියාගත වූ දැනුම, කුසලතා වර්ධනය කරගැනීම අරමුණු කර ගත් පිරිසක් වීම.
- එමෙන්ම ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන වල පුහුණුව ලැබූ වැඩි පිරිසක් රැකියා බහුලව කේන්ද්‍රීයව පවතින නාගරික ප්‍රදේශයන්හි රැකියාගත වීමට ඇති අකමැත්ත හා ගෙවනු ලබන වැටුප් ඔවුනට නේවාසිකව සිට රැකියා කිරීමට ප්‍රමාණවත් නොවීම.
- අප ආයතනයේ ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා සඳහා යොමුවන්නන්.

එසේ වුවද පවතින ආර්ථික අවපාතයන් යටතේ පවත්නා රැකියා අවස්ථා අහිමි වීම මතද දත්ත තහවුරු කර ගත් පුහුණුලාභීන් 5686 ක් රැකියාගත වීම 2022.12.31 දිනට වාර්තා වී ඇති අතර අනෙකුත් රැකියා ස්ථානගත වීම් තහවුරු කර ගනිමින් පවතී.

කර්මාන්ත සබඳතා අංශය විසින් දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත සැසි පිහිටු වීම හා රැකියා වෙළඳපොල පැවැත්වීමට ආරම්භ කර ඇති අතර ඒ තුලින් රැකියාගත කිරීම තවදුරටත් වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

අංකය	පුහුණු ක්ෂේත්‍රය	රැකියා ගත කල සංඛ්‍යාව			
		දේශීය	විදේශීය	ස්වයං	එකතුව
01.	ගොඩනැගිලි හා ඉදිකිරීම්	421	12	119	552
02.	මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව	429	12	40	481
03.	විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ	483	18	120	621
04.	ශීතකරණ හා වායු සමීකරණ	173	7	18	198
05.	ආහාර තාක්ෂණය	333	25	43	401
06.	සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය	648	3	84	735
07.	හෝටල් හා සංචාරක	440	35	24	499
08.	ලෝහ හා ලුහු ඉංජිනේරු	280	12	9	301
09.	දැව ආශ්‍රිත	192	2	47	241
10.	මැණික් හා ස්වර්ණාභරණ	17	5	5	27
11.	මුද්‍රණ හා ඇසුරුම්	46	-	-	-
12.	රෙදිපිළි හා ඇඟලුම්	554	3	266	823
13.	පුද්ගල හා සමාජ	446	5	238	689
14.	කෘෂිකාර්මික වැවිලි හා පශු සම්පත්	6	-	2	-
15.	සම් ආශ්‍රිත නිෂ්පාදන	19	-	8	-
16.	කාර්යාල කළමනාකරණය	32	-	4	36
	එකතුව	**4519**	**139**	**1027**	**5685**

රැකියාගත කිරීම




රැකියා ස්ථාපනය තුළින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

වර්ගය	ස්ථාපනය කළ සංඛ්‍යාව	ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රු. මිලියන)
දේශීය රැකියා	4519	2487
විදේශීය රැකියා	139	214
ස්වයං රැකියා	1027	762
එකතුව	**5685**	**3463**

(තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හී දත්ත මත 2022 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරක කාලයක් සේවය කරනු ලැබූ බවට උපකල්පනය කර ඉපයූ ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)

වර්ෂය	දේශීය	විදේශීය	ස්වයං	එකතුව
2018	6542	107	1374	**8023**
2019	3912	47	687	**4646**
2020	2316	13	426	**2755**
2021	935	28	175	**1138**
2022	4519	139	1027	**5685**




(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි*

රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නිරන්තරයෙන් පෞද්ගලික අංශය හා එක්ව විවිධ ශිල්පීය දක්ෂතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ ප්‍රජාව දිරිගැන්වීමේ කාර්යය සිදු කරනු ඇත.

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	අනුග්‍රාහක ආයතන
ටයිල් ඇතිරීම	08	341	ලංකා ටයිල්ස් සමාගම
රූපලාවන්‍ය, කොණ්ඩා කැපීම	1	65	නේචර්ස් බියුටි ක්‍රියේෂන් , ටියාරා මාකටින් සමාගම
ඇලුමිනියම් පිරිසැකසුම්	10	398	ස්විස්ටෙක් ඇලුමිනියම්
විදුලි කාර්මික	7	350	ACL කේබල්ස්
මෝටර් සයිකල් හා ත්‍රී වීල්	3	115	හේමන්ත Pvt Ltd
එකතුව	**32**	**1419**	



ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරනු ලබන තරුණ තරුණියන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 19 ක් පවත්වා 347 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීමට හැකි වූ අතර අදාළ වූ විවිධ රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් SEPI ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීම මෙම වසරේදී ඉටුකල නොහැකි විය.

අභියෝග

- වර්තමාන තරුණ පරපුර ආකර්ශනය කරගත හැකි මට්ටමේ පෙනුමක් සහිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව අවම වීම.
- නවීන තාක්ෂණික පුහුණු ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා අන්තර්ග්‍රහණය කිරීමට සම්පත් ප්‍රමාණවත් නොවීම.
- වර්තමාන තරුණ පරපුර ආකර්ශනය කරගත හැකි මට්ටමේ පෙනුමක් සහිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව අවම වීම.
- ගුණාත්මක පුහුණුවක් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය උපදේශක කාර්යය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් මට්ටමින් ඔවුන්ට නොලැබීම මත සේවය හැරයාමේ නැඹුරුවක් පැවතීම.
- පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා දැනුම, හැකියාව, පළපුරුද්ද ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- වර්තමානයේ රට තුල ඇති වී තිබෙන ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ වැඩි සාමාජීය ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා අයත් උපදේශකවරු විදේශ රැකියා සඳහා යොමු වීම සහ ඒ සඳහා නව උපදේශකවරු බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය සහ ප්‍රතිපාදන නොමැති වීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම හා පුළුල් ප්‍රචාරාත්මක ක්‍රියාදාමයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොලැබීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම මත දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදු වීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා ඉල්ලුම අතර ඇති නොගැලපීම අවම කර ගැනීමට අත්‍යාවශ්‍ය වන නවීන තාක්ෂණික උපකරණ හිඟවීම.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විගණන කමිටුව
කාර්ය සාධනය 2022

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විණනය යනු කළමනාකරනය වෙත කෙරෙන සේවාවක් ලෙස ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා පවත්නා සංවිධානය තුල වූ ස්වාධින තක්සේරුමය කාර්යයකි.එය සංවිධානක් තුල සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දායකත්වය ලබා දෙන කාර්යයක් ලෙස අභ්‍යන්තර පාලන, මූල්‍ය හා වෙනත් කරුණු වල සථලතාවය මැනීම, ඇඟයීම සහ වාර්තා කිරීම පාලනය කරන්නා වූ විධි ක්‍රමයකි.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක , විගණන කමිටු හරහා අධිකාරියට වාර්තාකරන අතර සියලුම පරිපාලන කටයුතු සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගනක වාර්තා කරන්නේ අධිකාරියේ සභාපති වෙත පමණි. ප්‍රමුඛතා කාර්යයන් සකස්කර නියම කිරීමටත්, විගණන සැලසුමක් සකස් කිරීමටත්, සොයාගනු ලබන ප්‍රධාන අනාවරණ හා තොරතුරු නිවැරදිව හා කාලෝචිත ලෙස විගණන කමිටු හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සැපයීමටත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විගණන කමිටුව හා එක්ව කටයුතු කරයි.

විගණන කමිටු වාර්තාව

සංයුතිය

සමාලෝචිත වර්ෂය තුල කමිටුවේ සාමාජිකයන් පහත පරිදි විය.

සභාපති

(i) ටී.එම්.ජේ.බණ්ඩාර මයා (2022.1.1 සිට 2022.5.25 දක්වා)
කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

(ii) යූ.එන්.මල්ලවාරච්චි මයා(2022.05.26 රැස්වීමේ සිට)

කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සාමාජිකයින්

සමන් ඩී වඩුගේ මයා, කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

පියදාස මාරම්බගේ මයා, කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

චතුර ද සිල්වා මයා, කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

නම	සහභාගී වූ රැස්වීම් ගණන	2022 වර්ෂයේ පැවති මුලු රැස්වීම්
ටී.එම්.ජේ.බණ්ඩාර මයා	01	03
යූ.එන්.මල්ලවාරච්චි මයා	02	
සමන් ඩී වඩුගේ මයා	03	
පියදාස මාරම්බගේ මයා	02	
චතුර ද සිල්වා මයා	01	

ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරි හා අධ්‍යාපන අමාත්‍යංශය නිපුණතා සංවර්ධන , වෘත්තීය අධ්‍යාපන , පර්යේෂණ හා නව නිපැයුම් අංශයෙහි ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂණයන් ලෙස රැස්වීම් සඳහා සහභාගීවූ අතර සියලුම අංශ ප්‍රධානින් ඔවුන් වෙත කරනු ලබන ආරාධනය අනුව රැස්වීම්වලට සහභාගී විය.

කමිටු ලේකම්

ප්‍රධාන අභ්‍යන්තර විගණක ජේ.එම්.පී.සිරිවර්ධන මිය කමිටු ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

අරමුණ

අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශන මඟින් කමිටුවේ අරමුණ පැහැදිලිව නිර්වචනය කර ඇත.

විගණන කමිටුව ස්වකීය වගකීම පහත සඳහන් කරුණු ද ඇතුලත්ව ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය ලබා දෙයි.

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම,ඉදිරිපත් කිරීම හා මූල්‍ය ප්‍රකාශ තුල හෙලිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව
- මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරි පනත හා මූල්‍ය වාර්තාකරණයට අදාල අනෙකුත් රෙගුලාසි හා නියමයන් විෂයයෙහි අනුකූලතා දැක්වීම.
- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල නියමයන් සපුරාලීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන විධි ප්‍රමාණවත් බවට වග බලාගැනීමේ ක්‍රියාවලි
- අභ්‍යන්තර විගණන කර්තව්‍යන් කාර්යසාධන සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ඉහල කලමනාකාරීත්වයෙහි සේවා නිරත තැනැත්තන් හා සම්බන්ධ අදාල පාර්ශවීය ගණුදෙනු වාර්තා කිරීම.

අභ්‍යන්තර විගණනය

විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ විෂයපථය, කාර්යසාධනය, අභ්‍යන්තර විගණක කර්තව්‍යය-න්හි ඵලදායිතාවය හා අභ්‍යන්තර විගණකවරුන්ගේ අපක්ෂපාතීත්වය යන කරුණු පිළිබඳව සමාලෝචනය කරන ලදි.

බාහිර විගණනය

විගණන කමිටුව විසින් විගණාධිපතිවරයාගේ වාර්තාව, එහි ප්‍රධාන අනාවරණ සහ මතුකල ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් කලමනාකරණය ගනු ලැබූ ක්‍රියාමාර්ග සමාලෝචනයට භාජනය කරන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාපිළිවෙත් නිර්දේශ කරනු ලැබීය.

අනුකූලතාව දැක්වීම

අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා ඵලදායිතාව පිළිබඳ මෙන්ම නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම පිලිබඳව ද එසේ අනුකූලතාව නොදැක්වූ යම් අවස්ථාවක් වේනම්, ඒ සම්බන්ධයෙන් ගත් පසුවිපරම් කිරීමේ ක්‍රියාමාර්ග පිලිබඳව කමිටුව අධීක්ෂණය කරයි.

විගණන කමිටු රැස්වීමේදී අවධානයට ලක්වන ප්‍රමුඛ ක්ෂේත්‍රවල හා එළඹී නිගමනවල සාරාංශ

සමාලෝචිත වර්ෂය තුල පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ නිසිපරිදි සලකා බලන ලදි.

කාර්ය මණ්ඩල සඳහා 75% වට්ටම් (P/T)	378,962.50	

විස්තරය	හර	බැර
අනුමත පාඨමාලා හැරයාම් (P/T)	3,006,140.00	
අර්ධ කාලීණ විදුලි බලය	177,146.00	
අර්ධ කාලීණ විභාග සහ ඇගයීම්	730,713.50	
අර්ධ කාලීණ දේශක ගාස්තු වියදම්	30,716,565.75	
අර්ධ කාලීණ විවිධ වියදම්	21,550.00	
අර්ධ කාලීණ කාර්ය මණ්ඩල දිරිදීමනා	837,624.00	
අර්ධ කාලීණ ලිපද්‍රව්‍ය	49,896.50	
අර්ධ කාලීණ අධීක්ෂණ සහ වෙනත් දීමනා	603,325.00	
අර්ධ කාලීණ පුහුණු ද්‍රව්‍ය	9,321,791.09	
මුද්‍රණ පාසල		
මුද්‍රණ පාසල් ආදායම		136,471.00
මුද්‍රණ පාසල පුහුණු ද්‍රව්‍ය	71,185.00	
RPL		
RPL ආදායම		16,704,131.08
RPL ආදායම (ILO)		6,607,478.00
RPL ආදායම් අන්තරික අයවැය - අමාත්‍යාංශය		6,544,000.00
ඔබඩසඳහා වියදම (RPL)	3,079,933.50	
RPL - අන්තරික අයවැය සඳහා වියදම	3,424,724.50	
RPL වියදම් - විභාග ගාස්තු	4,081,676.74	
EPL වියදම් - වෙළඳ දැන්වීම්	1,500.00	
EPL වියදම - යන්ත්‍ර සූත්‍ර නඩත්තුව	35,585.00	
EPL වියදම් - පැනල සහ අධීක්ෂණය	1,128,550.50	
EPL වියදම - කාර්ය මණ්ඩල දිරි දීමනා	67,810.00	
EPL වියදම - පුහුණු ද්‍රව්‍ය	835,434.15	
ක්ෂෙත්‍ර පරීක්ෂණ		
ක්ෂෙත්‍ර පරීක්ෂණ ආදායම		480,000.00
ක්ෂෙත්‍ර පරීක්ෂණ කාර්ය මන්ඩල දිරිදීමනා	64,800.00	
ක්ෂෙත්‍ර පරීක්ෂණ පුහුණු ද්‍රව්‍ය	303,150.00	
අහංගම - හෝටලය		
ආහාර සහ පාන වර්ග ආදායම		1,180,870.00
ශාලා ආදායම (සී ස් පේස්))		128,600.00
පිහිනුම් තඨාක ආදායම		32,300.00
කුලී ආදායම(ස්ථාන)		40,000.00
කාමර ආදායම		514,088.00
විදුලි බලය	548,918.34	
ආහාර සහ පාන වර්ග වියදම්	350,604.00	
සනීපාරක්ෂක සෙවාවන්	344,306.60	
ලොන්ඩරි වියදම්	122,510.00	
ගොඩනැගිලි නඩත්තුව	465,735.00	
යන්ත්‍ර සූත්‍ර නඩත්තුව	379,643.80	
විවිධ වියදම්	61,473.00	
අතිකාල සහ නිවාඩු දින වියදම්	244,994.70	

විස්තරය	හර	බැර
ජල බිල්පත්	19,988.93	
වෙනත් නිෂ්පාදන ඒකක		
තලල්ල ආපන ශාලා ආදායම		1,371,060.00
තලල්ල ආපන ශාලා වියදම්	934,049.32	
වෙනත් නිෂ්පාදන ඒකක ආදායම		2,401,766.00
වෙනත් නිෂ්පාදන ඒකක - ලිපිද්‍රව්‍ය	41,605.00	
වෙනත් නිෂ්පාදන ඒකක - ශ්‍රම වියදම	126,000.00	
වෙනත් නිෂ්පාදන ඒකක - ප්‍රේශක ගාස්තු	303,700.00	
වෙනත් නිෂ්පාදන ඒකක - විවිධ වියදම	261,845.00	
වෙනත් නිෂ්පාදන ඒකක - ප්‍රවාහන වියදම	189,815.00	
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
අධ්‍යාපන අමාත්‍යාංශය- උපද්ශක දිරිදීමනා		112,827,689.50
SFIG සඳහා ආධාර		371,666.00
TVEC නිපුණතා වැඩ සඳහා ආධාර		607,680.00
ILO සඳහා ආධාර		6,409,201.85
නිපුණතා සිසු සවිය සඳහා ආධාර		138,872,000.00
අමාත්‍යාංශය සඳහා ආධාර		1,998.00
සේවක වියදම		
E.P.F. වියදම්	122,637,015.34	
E.T.F. වියදම්	30,660,546.49	
වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම)	290,911,989.33	
වැටුප් සහ අතිකාල	883,266,085.35	
කාර්ය මණ්ඩල පාරිතෝෂිකය	51,734,600.00	
ගමනාගමනය		
ගමනා ගමන වියදම්	134,742.00	
ගමනාගමනය - විදේශීය	4,779,458.10	
භාණ්ඩ සමීක්ෂණ වියදම්	4,171,309.00	
සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය		
ඉන්ධන සහ ලිහිස්සුම් ගාස්තු	28,203,625.80	
වෙනත් සැපයුම්	1,877,827.11	
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	12,114,179.94	
මුද්‍රිත ද්‍රව්‍ය	5,454,801.35	
නඩත්තුව		
ගොඩනැගිලි නඩත්තු කිරීම	17,824,346.34	
දේපල සහ පිරියත නඩත්තුව	11,965,387.21	
වාහන නඩත්තු කිරීම	11,563,774.41	
කාර්යාල උපකරණ නඩත්තුව	5,031,911.21	
ගිවිසුම්ගත සේවා		
වෙළඳ දැන්වීම්	2,014,337.79	
විගණන ගාස්තු	1,200,000.00	
විදුලි බල ගාස්තු	60,224,944.34	

විස්තරය	හර	බැර
කුලී අය කිරීම්	2,704,064.00	
රක්ෂණය	5,459,885.80	
සනීපාරක්ෂක සේවා	21,658,894.71	
පුවත්පත් සහ වාර ප්‍රකාශන	430,307.83	
තැපැල් ගාස්තු	1,283,347.86	
කුලී, වරිපනම් සහ බදු	8,633,991.99	
ආරක්ෂක ගාස්තු	57,542,283.40	
කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත්	911,022.00	
දුරකථන ගාස්තු	28,100,251.43	
ප්‍රවාහනය	1,741,355.00	
ජල බිල්පත්	14,552,747.79	
උපදෙස් සහ වෘත්තීය ගාස්තු	405,000.00	
රැකියාගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		
විෂයමාලා සංවර්ධනය	405,530.00	
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	5,345,565.06	
ව්‍යවසායකත්ව වැඩසටහන්	624,246.25	
රැකියාගත කිරීම	3,098,495.00	
පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන	731,349.50	
රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය	702,364.25	
වෙනත් මෙහයුම් වියදම්		
අනුමත හැරයාම්	325,050.00	
විභාග සහ ඇගයීම්	48,298,372.43	
ප්‍රසාද දීමනා	633,000.00	
නෛතික ගාස්තු	592,402.00	
විවිධ වියදම්	4,251,539.37	
තත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය	5,549,408.50	
වාර ප්‍රවේශ පත්‍ර	15,571,110.29	
විශේෂ පුහුණු වැඩසටහන	349,485.00	
ආවුද සහ පර්යේෂණ ද්‍රව්‍ය	3,791,139.20	
පුහුණු අධීක්ෂණය	316,604.00	
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
නිපුණතා සිසු සවිය සඳහා වියදම	138,872,000.00	
උපදේශක දීමනා සඳහා වියදම	112,827,689.50	
ILO සඳහා වියදම	6,409,201.85	
SFIG සඳහා වියදම	371,666.00	
TVEC නිපුණ වැඩ සඳහා වියදම	607,680.00	
අමාත්‍යාංශය සඳහා වියදම	1,998.00	
මූල්‍ය පිරිවැය		
බැංකු අය කිරීම්	166,881.00	
පුහුණු ද්‍රව්‍ය	131,608,714.56	
කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය	8,937,679.90	

විස්තරය	හර	බැර
ප්‍රවර්ධන වියදම්	13,200,211.58	
වෘත්තීය මාර්ගෝපදේශනය	1,107,461.00	
ක්ෂය වීම්	588,968,574.91	
මූල්‍ය ලීසිං සඳහා පොලී	2,365,180.00	
කල්බදු ක්‍රමය යටතේ වාහන බද්දට / කුලියට දීම	4,427,506.64	
ලාභ /පාඩු ගිණුම්		4,488,492,944.19
පෙර වසරේ ගැලපීම්		29,422,032.16
මුළු එකතුව	**13,292,965,038.49**	**13,292,965,038.49**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/D/VTA/1/2022/23

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 අගෝස්තු 17 දින

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 වගන්තිය අනුව අධිකාරිය විසින් ඔවුන්ට හිමිකාරිත්වය නොමැති ඉඩම් 20 ක ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම හා අධිකාරියට අයිති ඉඩම් 08 ක් ද එම ඉඩම්වල ඉදිකර තිබූ ගොඩනැගිලිවල වටිනාකම ද තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේදී සිදුකල ප්‍රත්‍යාගණනයේදී හඳුනාගෙන තිබූ ප්‍රත්‍යාගණන අතිරික්තය ගිණුම් තැබීමේදී, 2018 වර්ෂයේදී සිදුකල වත්කම් ප්‍රත්‍යාගණනයේදී හඳුනාගෙන තිබූ රු.51,409,653ක් වූ ප්‍රත්‍යාගණන අලාභයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 52 ඡේදය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය සහ ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී මූල්‍ය කල්බදු පදනම යටතේ මිලදී ගත් මෝටර් රථ 03 කට අදාල මූල්‍ය කල්බදු වගකීම සහ පොලී වියදම ගිණුම් තැබීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 හි දක්වා ඇති පරිදි ව්‍යංග (implicit) පොලී අනුපාතිකය පදනම් කර නොගැනීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන සහ ජංගම කල්බදු වගකීම පිළිවෙලින් රු.1,177,479 ක් සහ රු.1,119,992 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය රු.2,297,471 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2021 නොවැම්බර් 30 දින ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ පිරිවැය රු.7,743,902ක් වූ මාතර දිස්ත්‍රික්කයේ රුහුණුගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම එම අගයෙන් හා රැඳවුම් මුදල් ගිණුමේ ශේෂය රු.398,158 ක් අඩුවෙන් ද කෙරිගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.7,345,744 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි හා මෝටර් රථ වත්කම් පංති සඳහා ක්ෂය ගණනය කිරීමේදී 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල අත්පත් කරගත් වත්කම් වලට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ක්ෂය ගණනය කිරීමේදී ද්වි ගණනය වී තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වියදම රු.134,630,322ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2022 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2022/2023 අධ්‍යයන වර්ෂ සඳහා ආරම්භ කරන ලද අර්ධකාලීන පාඨමාලා 09 ක 2023 වර්ෂයට අදාල රු.3,054,300 ක වියදම් 2022 වර්ෂයේ වියදම්

ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) අධිකාරියේ විභාග හා ඇගයීම් අංශයෙන් හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහතිකපත් නිකුත් කිරීමේ අංශයෙන් ලද තොරතුරු අනුව, NVQ සහතික පත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.8,156,600 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) විශේෂ ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු.13,266,934 ක් හා හුවමාරු නොවන ගනුදෙනුවලින් ජනිත වූ ප්‍රාග්ධන ප්‍රදාන අයභාරය යටතේ ගිණුම්ගත කර තිබුණු රු.18,632,491 ක් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(එ) විශේෂ ව්‍යාපෘතීන් ඉටු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත විවිධ ආයතන විසින් 2022 වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී ලබා දී තිබුණු එකතුව රු.45,326,885 ක් තැන්පතු ගිණුමකට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ඒ) ගිණුම්කරණ පද්ධතිය සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී 2022 වර්ෂයේදී පද්ධතියට ඇතුලත් කර තිබූ දත්තයන් 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය තුල ජර්නල් සටහන් යෙදීමකින් තොරව එකතුව රු.1,155,529 ක් වූ ලදුපත් 144 ක් හා එකතුව රු.1,027,250 ක් වූ විකුණුම් ඉන්වොයිස් 96 ක් මකා දැමීම් (delete) හා සංශෝධනය කර තිබූ බව අනාවරණය විය. එසේම ගිණුම් පද්ධතියට දත්ත ඇතුලත් කරන නිලධාරීන්ට කිසිදු පාලනයකින් තොරව දත්ත වෙනස් කිරීමේ අධිකාරී බලය ද ලබා දී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්න ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය මුදල් රෙගුලාසි 371(2)(ආ)	යම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 12 කදී රු.100,500 සිට රු.340,404 ක පරාසයක් තුල එකතුව රු.1,788,693 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 221/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.7,659,583,443 ක් වූ දේපළ පිරියත හා උපකරණවල නිවැරදිභාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, 2023 වර්ෂය සඳහා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවම ලංසුකරු වෙත ලංසු වලංගු කාලය තුල කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වගකිවයුතු නිලධාරීන් කටයුතු නොකිරීම නිසා දෙවන ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් රු.2,038,700 ක් වැඩි මිලකට සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමට සිදුවී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව අධිකාරියේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අයත් පුහුණු මධ්‍යස්ථාන 11 ක පවත්වන ලද පාඨමාලා 13 ක් සඳහා බඳවාගත් ආධුනිකයන් හා ඉලක්කගත සංඛ්‍යාව සමඟ සැසඳීමේදී, බඳවා ගැනීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 66 දක්වා අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම එම පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 20 සිට සියයට 58 දක්වා පරාසයක් ගෙන තිබුණු අතර එම පාඨමාලා හැරයාමට හේතු සොයා බලා ඒවාට අවශ්‍ය පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ (SSDP) මූල්‍ය ප්‍රතිපාදන මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 03 ක නවීකරණ කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී උපදේශක සමාගම් වෙත රු.1,212,570 ක් ගෙවා තිබුණු නමුත් එම නවීකරණ කටයුතු 2023 ජූලි 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු කර නොකිරීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි.

(ඇ) හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භකරන ලද වැඩහල් ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කරන ලද රු.19,053,095 ක් 2017 වර්ෂයේ සිට කෙරිගෙන යන වැඩ ගිණුම තුල දක්වා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් අතරමඟ නවතා දැමීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකරන ලද කොටස් දිරාපත් වෙමින් පැවතුණි.

(ඈ) අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයක් දරන ලද 2006 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස සේවය කරමින් ආයතන දෙකෙන්ම දීමනා සහ ප්‍රවාහන පහසුකම් ලබාගෙන ඇති බවත් අදාල කාලය තුල මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් මාසික දීමනා වශයෙන් රු.5,443,723 ක් ලබාගෙන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස 2015 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකාරියේ සභාපති වෙත දන්වා ඇතත් එම පරීක්ෂණය 2023 ජූලි 30 දින වන විටද සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) ඔරුගොඩවත්ත ශ්‍රී ලංකා ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා 2020 වර්ෂයේදී කොරියානු රජයේ ආධාරයෙන් සිසුන් 100 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි කාමර 48 කින් යුත් සියලු පහසුකම් සහිත ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදි කර තිබුණ ද විගණිත දිනය වූ 2023 ජුනි 30 වන විටද පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු අතර උපදේශකවරුන් 14 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් ලබා දී තිබුණි. එමෙන්ම, 2022/2023 වර්ෂයේ පාඨමාලාවලට සම්බන්ධ වූ සිසුන් 400 කගෙන් සිසුන් 110 කට ආසන්න සංඛ්‍යාවක් පුහුණු ආයතනය පිහිටි බස්නාහිර පලාතෙන්

පිටත ස්ථිර පදිංචිය සහිත සිසුන් වන අතර එවැනි සිසුන්ට සහනයක් සැලසීම තුලින් වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමුවීමේ වර්ධනයක් සිදුවන ආකාරයෙන් කටයුතු කර නොතිබුණු අතර විදේශාධාර (ණය) උපයෝගී කරගෙන ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල වසර 03 ක සිට අදාල අරමුණට යොදා නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරන සිසුන්ගේ වැඩිදුර පුහුණු කටයුතු සඳහා සහ වඩා හොඳ පුහුණුවක් ලබාදීමේ පරමාර්ථයෙන් අහංගම හෝටල් පාසැල රු. මිලියන 148.92 ක් වැයකර 2019 වර්ෂයේදී හෝටලයක් ලෙස නවීකරණය කර තිබුණද එම වර්ෂයේ සිට 2023 ජුනි 30 දක්වාම මෙම සංචාරක හෝටලය තුලින් කිසිදු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දී නොතිබුණි.

(උ) අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හා යාපනය දිස්ත්‍රික්කයේ කරෛනගර් හෝටල් පාසැල් පරිශ්‍රය තුල අධිකාරියේ අරමුණින් බැහැරව සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණ ඇතිව රු.91,026,186 ක් වැයකර ඉදිකර තිබූ කාමර 22 ක් 2023 ජූලි 30 දින වන විටද ඌන උපයෝජිතව පැවතුණි.

(ඌ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2003 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලසීමාව ඇතුලතදී සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරීන් 35 දෙනෙකුගෙන් අධිකාරිය වෙත අයවිය යුතු රු.20,246,792 ක මුදල 2023 ජූලි 26 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරය වෙත රජයේ ආයතන 03 කින් ලැබිය යුතු එකතුව රු.5,512,969 ක් වූ ශේෂ වර්ෂ 10 ක් ඉකුත් වී තිබුණද 2023 මැයි 31 දින වන විටද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඒ) නුවරඑළිය වනරාජවත්ත ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙන් රූඩ් 3 පර්චස් 31.3 ක් අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2018 අප්‍රේල් 25 දින ගෙවන ලද රු.9,280,000 ක් ද ඉහත අත්තිකාරම් ශේෂය තුල ඇතුලත් වන අතර ඉඩමෙහි නිරවුල්භාවය පිලිබඳ සැලකිලිමත් නොවී මෙම මුදල ගෙවීම නිසා වසර 05 ක් ගතවන විටද ඉඩමෙහි අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට හෝ ගෙවන ලද මුදල් අයකර ගැනීමට හෝ නොහැකි වී තිබුණි.

(ඔ) මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියෙහි අරමුණට පටහැනිව පරිගණක පාඨමාලාවක් සඳහා රු.11,721,081 ක් වැයකර පරිගණක 30 ක් හා පරිගණක උපාංග මිලදී ගෙන තිබුණි.

(ඕ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100 ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියේ අරමුදල් වලින් VTA Holdings Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ සමාගම ඇවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජූනි 20 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබුණද එම වාර්තාව 2023 ජූලි 20 දින වන විටද සකස් කර නොතිබුණි.

(ඖ) 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 හා 2022 වර්ෂවලදී ඇනවුම් කරන ලද එකතු වටිනාකම රු.28,078,556 ක් වූ උපකරණ වර්ග 19 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සැපයුම්කරුවන් විසින් අධිකාරිය වෙත සපයා නොතිබුණි. තවද, 2019 හා 2022 වර්ෂයේදී ඇනවුම් කර, අධිකාරියට ලැබී තිබූ උපකරණ වලින් රු.4,589,944 ක්වූ අයිතම වර්ග 07ක් පිරිවිතරයන්ට නොගැලපීම නිසා ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විටද එම අයිතම නැවත සපයා නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා වූ පිළිතුරු වාර්තාව.

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) මෙම ඉඩම් 28 ට අදාලව අයිතිය පවරාගෙන ඇති ඉඩම්වලින් 24 ක වටිනාකම තක්සේරු කර ඇති අතර අයිතිය පවරාගෙන නොමැති ඉඩම්වල ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොකරන බැවින් ආයතනය මගින් පත් කරන ලද කමිටුවක් මගින් එහි වටිනාකම තක්සේරු කර හිණුම් වලට ගැලපීමට කටයුතු කරමි.

(ආ) මේ වන විට නිවැරදි කර ඇත.

(ඇ) 2023 වර්ෂයේදී නිවැරදි කර ඇත.

(ඈ) 2023 වර්ෂයේදී නිවැරදි කර ඇත.

(ඉ) මේ වන විට නිවැරදි කර ඇත.

(ඊ) 2023 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි.

(උ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සහතික පත් නිකුත් කිරීමේ ගාස්තුව රු.20 සිට රු.500 ක් දක්වා වැඩි කර තිබූ අතර මෙයට අදාළ ඉන්වොයිසිපත් අධිකාරිය වෙත 2023.01.18 ලැබී තිබුණි. මේ වන විටත් මෙම මිල වැඩි වීම් සඳහා විකඟතාවයකට එළඹ නොමැති අතර 2022 වර්ෂයට අදාළව මේ සඳහා ප්‍රතිපාදනද නොමැත. කෙසේ නමුත් ඉදිරියේදී එළඹෙන විකඟතාවය මත 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම ගෙවීම සිදු කිරීමට අපේක්ෂිතය.

විස්තරය	වෙනස රු.	හේතුව
Nipunatha Sisu saviya	11,872,000.00	2021 වර්ෂයේ ලද මුදල් වන අතර සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
Staff incentive	646,945.00	සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
Ministry SFIG	371,661.00	සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
Skill work TVEC	374,325.00	සාක්ෂි ඉදිරිපත් කර ඇත.
	13,266,934.00	
ප්‍රාග්ධන වියදම් 13 Years	5,769,800.00	පෙර වර්ෂ වල ලැබීම් වන අතර සාක්ෂි ඉදිරිපත් කර ඇත.
Early child Hood	12,862,691.29	පෙර වර්ෂ වල ලැබීම් වන අතර ඉදිරියේදී සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	18,632,491.29	

(ඒ) විශේෂ ව්‍යාපෘති මගින් සිදු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත විවිධ ආයතන මගින් ලැබී ඇති මුදල් ඒ ඒ ව්‍යාපෘති යටතේ වෙන වෙනම ලෙජර් ගිණුම්වල සටහන් කර ඇති අතර එය අවසන් ගිණුම්වල ද ව්‍යාපෘති යටතේ ගෙවිය යුතු මුදල් ලෙස පෙන්නුම් කිරීම නිවැරදිය.

(ඓ) 2022 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කටයුතු වලදී සහ වර්ෂ අවසාන මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේදී අනාවරණය කරගත් පරිදි බැංකු ගිණුමට සෘජුවම බැර කර ඇති වටිනාකම් සඳහා ලදුපත් ඇතුලත් කිරීම අතරතුර අත්වැරදීමකින් ලදුපත් කිහිපයක් දෙවරක් ඇතුලත් කිරීම නිවැරදි කිරීමට සිදුවිය. මෙහිදී ප්‍රායෝගික ගිණුම්කරන භාවිතාව තුල මුදල් පොතට ජර්නල් සටහන් ඇතුලත් කිරීම සිදු නොකරන බැවින් අදාල ද්විගණන දෝෂය නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ මුදල් ගේ අනුමැතිය සහිතව එම වැඩිපුර ඇතුලත් වූ ලදුපත් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

අනෙකුත් සංශෝධනය කිරීම් ද ගිණුම් නිවැරදි කිරීම සඳහා සිදුකරන ලද සංශෝධනයන් වන අතර ගිණුම් පද්ධතියට දත්ත ඇතුලත් කරන අවස්ථා වල එම ගනුදෙනු හා සිදුවීම් වලට අදාලව සටහන් කල යුතු ගිණුම් පිළිබඳ නිවැරදිව හා පූර්ණ වශයෙන් හඳුනාගැනීමට ඇතැම් අවස්ථා වල ප්‍රායෝගික ගැටළු ඇති වීමත් පසුව සියළු තොරතුරු නිවැරදිව හඳුනාගත් පසු ඒවායේ නිවැරදි කිරීම් සඳහා ජර්නල් සටහන් ඇතුලත් කිරීමත් නිසා ලෙජර් ගිණුම් තුල ඇතිවිය හැකි දත්තයන්ගේ සංකීර්ණ බව අවම කිරීම සඳහා අදාල මුල් ඇතුලත් කිරීම මගින්ම නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කර ඇත.

කෙසේ නමුත් විගණන වාර්තා මගින් අදාල කරුණු පිළිබඳ සිදුකල අනාවරණයෙන් පසුව මෙතෙක් පැවති ගිණුම් පද්ධතිය භාවිතා කිරීමේ පාලන ක්‍රමවේදය තවදුරටත් සමාලෝචනය කර විවිධ සීමාවන්ට යටත්ව ඉහත සඳහන් අවස්ථා ඇති නොවන පරිදි අනුමැතියන් හා ලිඛිත සාක්ෂි සහිතව ගිණුම් පද්ධතිය තුල අවශ්‍ය වැරදි නිවැරදි කිරීම් සිදුකිරීමේ නව ක්‍රමවේදයක් සකස් කර එය අනුගමනය කරන ලෙස සියළුම ගිණුම් පද්ධති පරිශීලක නිලධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.2

(අ) උපරිම සීමාවට යටත්ව කටයුතු කරමි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කරමින් පවතී.

2.2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව 2022.09.21 වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Express Environmental Service ආයතනය තෝරා ගෙන තිබුනි. 2022.09.15 වන දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ඉල්ලා අස් වී ඇති බැවින් නව සේවා සපන්නෙකු තෝරා ගැනීමට නොහැකි වුනි. මේ පිළිබඳව 2022.09.26 වන දින අමාත්‍යාශයේ ලේකම්වරයා වෙත ලිඛිතව දැනුවත් කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා ලෙස අමාත්‍යාංශ නියෝජිතයෙකු ලබා දෙන මෙන් ඉල්ලීමක් සිදු කර ඇත. ආයතනයට නව සභාපතිවරයෙකු 2022.10.12 වන දින පැමිණි විගස මෙම ලිපිගොනුව එකී සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. නමුත් අමාත්‍යංශය මගින් එසේ පැමිණි සභාපතිවරයා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට පත් කර එවා ඇත්තේ 2022.11.22 දිනය. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම කාර්යට අදාළ ලිපිගොනුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව 2022.12.16 දින ප්‍රසම්පාදන කමිටු තීරණය ලෙස අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Express Environmental Service ආයතනය තෝරා ගන්නා ලදී. එක් දිනක් පමණක් ප්‍රමාද වී ලබා දුන් මෙම ප්‍රසම්පාදන කමිටු තීරණයට අදාලව එම ආයතනය විසින් සේවා ඇණවුම භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම තත්වය ඇති වී ඇත. ලංසු වලංගු කාලය තුල මෙම තත්වය ඇති වීමට හේතු වූයේ නව සභාපතිවරයෙක් පැමිණීම, අමාත්‍යංශය මගින් එම සභාපතිවරයා ප්‍රසම්පාදන කමිටුවට පත් කිරීම හා මෙම ලිපි ගොනුව අධ්‍යයනය කිරීම සඳහා සැළකියයුතු කාල සීමාවක් ගත වීම හේතුවෙනි.

2.3 වෙනත් කරුණු

(අ) Covid19 වසංගතයත් සමඟ රට තුල පැවැති තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය පුහුණු කටයුතු වලට දැඩි බලපෑමක් විල්ල වූ අතර මාස 08. මාස 9 වූ පාඨමාලා කාලය මාස 16 *18 දක්වා කාලයක් දීර්ඝ වූ අතර වසරකට බඳවා ගත් කණ්ඩායම් ප්‍රමාණයද සාපේක්ෂව අඩුකිරීමට සිදුවිය. ඒ අනුව බඳවා ගැනීම් ප්‍රතිශතයද අඩු විය.

කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී පාඨමාලාවක් පවත්වා නොමැත. එහි බඳවා ගැනීම් ප්‍රතිශතය 10% ලෙස දක්වා ඇත.

2019 වර්ෂයේ ගොතටුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි ඇලූමිනියම් මෝස්තරකරු හා ගොඩනැගිලි දැව කාර්මික යන පාඨමාලාවන් දෙක පවත්වා නොමැත. ඒ අනුව බඳවා ගැනීම් ප්‍රතිශතය දක්වා ඇති තොරතුරු අනුව වෙනස් වේ.

පාතේගම සහ තොටගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මෙම දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන නොවේ. පහත්ගම මධ්‍යස්ථානයේ ජලනල සහ සෝලා පද්ධති තාක්ෂණ පාඨමාලා පවත්වා ඇත.

මේ සියළු කරුණු හේතුවෙන් දක්වා ඇති බඳවා ගැනීම් ප්‍රතිශතය වෙනස් වේ.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ (SSDP) මූල්‍ය ප්‍රතිපාදන මත පුහුණු මධ්‍යස්ථාන 90ක් නවීකරණය කර වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉංජිනේරු සැලසුම් සහ ප්‍රමාණ පත්‍ර සකස් කිරීමට, 2014 වසරේදි ජාතික තරඟ කාරී ක්‍රමය යටතේ උපදේශක සේවාවක් ලෙස තෝරා ගන්නා ලද Engineering & Design & Construction Company (ED & CC) ආයතනය වෙත 2014.09.09 දින ගිවිසුම්ගත ලබා දී තිබුණි. එහෙත්, 2014.12.29 දිනැති අතිරේක ලේකම් (ආංශික නිපුණතා සංවර්ධන) ගේ ලිපියේ උපදේස් පරිදි එම සේවාව නතර කිරීමට සිදු වුවත් ඒ වන විට සැලසුම් හා ප්‍රමාණ පත්‍ර සකස් කර අප වෙත ලබා දී තිබූ මධ්‍යස්ථාන 35ට ඉහත මධ්‍යස්ථාන 3 ද ඇතුළත් කර තිබුණි. එනමුත් ඉන් ඉදිරියට SSDP විසින් එක් එක් වසරවලදි ලබා දෙන ලද ප්‍රතිපාදන සීමාසහිත වූ බැවින් එම මධ්‍යස්ථාන 3හි ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුණි. එහෙත් ලබා දෙන ලද සැලැසුම් හා ඇස්තමේන්තු (ප්‍රමාණ පත්‍ර) ඉදිරියේදි ප්‍රයෝජනයට ගැනීම සඳහා අප සතුව ඇත.

තවද මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ගේ ද තීරණය පරිදි විගණන හා කළමණාකරන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

(ඇ) මෙම ව්‍යාපෘතිය හම්බන්තොට වරාය සංවර්ධන කටයුතු වලට සමගාමීව, වරාය මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් වැඩි සංඛ්‍යාවක් පුහුණු කිරීම අරමුණු කරමින් මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ පුහුණු ධාරිතාව වැඩිකිරීම සඳහා 2013.11.07 දින භාණ්ඩාගාර අරමුදල් යටතේ ආරම්භ කරන ලද අතර 2014.04.05 දින අවසාන වීමට සැළසුම් කර තිබුණි. පිළිගත හැකි සාධාරණ හේතූන් මත දින 35ක අමතර කාලයක්ද ලබා දීමෙන් පසු 2014.06.13 දින අවසාන වීමට නියමිතව තිබිණි. එහෙත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් එදිනටද ඉදිකිරීම් වැඩ අවසන් කළ නොහැකි වූ හෙයින් 2015.01.05 දින ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. ඉන්පසු පළමු මහළ කොන්ක්‍රීට් පුවරුව දක්වා ඉදිකළ ගොඩනැගිල්ල පරීක්ෂා කර භාර ගන්නා ලදී. එසේම කොන්ත්‍රාත් ආයතනය ලබා දී තිබූ රු.2,130,677.83ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය මුදල් බවට හරවා 2015.02.02 දිනැති චෙක්පත් අංක 573628 දරණ ලංකා බැංකු චෙක්පත මගින් අප අධිකාරිය වෙත ලබා දී අධිකාරියේ ගිණුමෙහි තැන්පත් කර ඇත. මෙයට අමතරව CIDA (ICTAD) කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව ඉතිරි වැඩ සඳහා 25%ක අධිභාරයක් එනම් රු.6,022,990.72ක් ද අය කරමින් අවසන් ගෙවීම්පත පිළියෙල කර ඇත.

ඉන්පසු 2015.08.25 දින ඉදිරි කටයුතු සඳහා උපදෙස් පතා ප්‍රසම්පාදන කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කළ අතර 2015.11.23 දිනද නැවත වරක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එහෙත් මේ සඳහා නිසි ප්‍රසම්පාදන කමිටු තීරණයක් ලබා දී නොමැත. 2016 වසරේ නැවත මෙම ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලද නමුත් පෙර ව්‍යාපෘතිය විධිමත්ව අවසන් කර නොතිබීම නිසා (ප්‍රසම්පාදන කමිටු තීරණය නොලැබීම හේතුවෙන්) නැවත ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නොලැබිණි. එහෙයින් මේ දක්වා මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකළ නොහැකි වූ අතර මෙම වියදම මේ දක්වා කෙරීගෙන යන වැඩ ලෙස දක්වා ඇත.

ඉන් පසු 2022 වසරේ විගණන කළමනාකරණ කමිටු උපදෙස් පරිදි මෙම ගොඩනැගිලිවල ස්ථායීතාව සහ දෝෂ පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම සඳහා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙන් (NERD & කළ ඉල්ලීම පරිදි එම ආයතනය විසින් මූලික පරීක්ෂාවක් සිදුකර, මෙම ගොඩනැගිල්ල පරමාණුක බලශක්ති මණ්ඩලය මගින් පරීක්ෂා කර වාර්තාවක් ලබාගත යුතු බව දන්වන ලදී. මේ සඳහා පරමාණුක බලශක්ති මණ්ඩලයෙන් ගෙන්වාගත් ඇස්තමේන්තුවෙහි කළයුතු පරීක්ෂාවන් සඳහා ඒකක මිළ ගණන් පමණක් දක්වා තිබූ අතර, සම්පූර්ණ ඇස්තමේන්තුවක් ලබාදීම සඳහා ස්ථානීය පරීක්ෂාවක් කළයුතු බව දන්වා තිබුනි.

ඒ අනුව, ඒ සඳහා කටයුතු කරමින් පවතින අතර මේ වන විට මෙම ව්‍යාපෘතියේ ගෙවීම් පිළිබඳව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙන් ලබාදී ඇති පැහැදිලි කිරීම් සැලකිල්ලට ගෙන අවසාන ගෙවීම් සඳහා නිර්දේශ ලබාගැනීමට 2023.05.09 දින විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කරන ලද අතර එම කමිටු වාර්තාවේ නිර්දේශය වන්නේ මෙම ගොඩනැගිල්ල NERD ආයතනයේ හා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පරීක්ෂාවෙන් දෙනු ලබන තීරණ අනුව අවශ්‍ය වෙනස්කම් හා එකතුකිරීම් සහිතව ෂෂ වන මහලද ඉදිකර ප්‍රයෝජනයට ගැනීමයි. ඒ අනුව අවශ්‍ය නවීකරණ කටයුතු කරමින් මෙම ගොඩනැගිල්ල ඵලදායී ලෙස පුහුණු කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරමි.

තවද, ඉහත කී ඉංජිනේරු තාක්ෂණික ඇගයීම් කමිටුවේ පෙන්වා දී ඇති පරිදි මෙම ව්‍යාපෘතිය නවත්වන අවස්ථාව වන විට අධිකාරිය විසින් රු. 845,226.51ක මුදලක් අදාළ කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවිය යුතු වේ. මෙම ගොඩනැගිලි පිළිබඳව හෑසෲ හා පරමාණුක බලශක්ති මණ්ඩලය යන ආයතන වල වාර්තාවද ලද පසු එම වාර්තාවේ ඇතුළත් වන කරුණු පිළිබඳව සලකා බලා, කොන්ත්‍රාත් ආයතනයේ යම් අයකර ගැනීමක් වේ නම් ඒ සඳහා සුරකුමක් ලෙස මෙම මුදල තාවකාලිකව රඳවා ගනිමින් ඉන් අනතුරුව ගෙවීමට කටයුතු කරමි.

(ඈ) 2023.08.09 දින පැවති පොදු ව්‍යාපාර කාරකසභාවේ ලබා දුන් උපදෙස් පරිදි ජනාධිපති ලේකම්ගෙන් මේ පිළිබඳව විමසීම් සිදු කර 2023.04.19 දින ලිපියක් යොමු කළ අතර ඒ සඳහා ජනාධිපති ලේකම් විසින් අදාළ ආයතන සමග සාකච්ඡා කර නිර්දේශ ජනාධිපති ලේකම් වෙත යොමු කරන ලෙස 2023.07.12 දිනැති ලිපිය මගින් අප අධිකාරිය වෙත දන්වා ඇත. ඒ අනුව සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ සාකච්ඡාව සඳහා දිනයක්, වේලාවක් හා නිලධාරියෙකු නම් කර එවන ලෙස 2023.08.31 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

(ඉ) ඔරුගොඩවත්ත කොරියානු ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලයේ නේවාසික පාලක තනතුර අනුමත වී ඇති නමුත් ඒ සඳහා බඳවා ගැනීම් සිදු නොකර ඇත. එබැවින් ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම් ලබා දී නොමැත. මේ වන විට බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමට සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවති. මේ වන විට ආයතනයේ උපදේශකවරුන් සඳහා මාසික දීමනාවක් අයකර ගෙන නේවාසික පහසුකම් ලබා දී ඇත.

(ඊ) අහංගම හෝටලය ඵලදායීව යොදා ගැනීම සඳහා ශ්‍රී ලංකා හෝටල් සංචාරක හා කළමනාකරණ ආයතනය (SLITHM) සමග හෝටල් පාසලේ වත්කම් විධිමත්ව උපයෝගී කර ගැනීම සඳහා දැනටමත් සාකච්ඡා කර ඇත. ඒ අනුව අහංගම හෝටලය SLITHM ආයතනය සමග නිරීක්ෂණය කරන ලදී. එම නිරීක්ෂණයේදී මෙම ආයතනය විසින් පාඨමාලාවන්හි විෂයමාලා සංවර්ධනය කිරීමටත් ආධුනිකයින් වැඩිදුර පුහුණු කිරීමටත් එකඟතාවය ඵලකළ අතර හෝටලය 2019 දී නවීකරණය සිදු කළත් හෝටලයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වන පරිදි නවීකරණය සිදු නොවී ඇති බව හඳුනා ගන්නා ලදී. එම නිසා මෙම හෝටලය වැඩිදුර පුහුණුලාභීන් සඳහා පුහුණුව සපයන හෝටලයක් ලෙස නඩත්තු කටයුතු සම්බන්ධයෙන් එකඟතාවයක් ලබා දී නැත. එබැවින් මේ පිළිබඳව අප අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලය මෙම හෝටලය ප්‍රසම්පාදන ක්‍රමවේද භාවිතා කරමින් නීත්‍යානුකූල ලෙස පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතනයක් වෙත දීර්ඝකාලීනව බදු දීමටත් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද මගින් ආයෝජකයින් තෝරා ගැනීමටත් උපදෙස් ලබා දී අනුමැතිය ලබා දී ඇත. තවද අදාළ බදු හිමිකරු විසින් අපගේ ආධුනිකයින් වැඩිදුර පුහුණුට බඳවා ගත යුතු බව බදු ගිවිසුම් වල සඳහන් කළ යුතු බව දැනුම් දී ඇත.

(උ) පොතුවිල් හා කරයිනගර් හෝටල් පාසල් සඳහා ද ඉහත (ඊ) මගින් කරුණු දක්වා ඇති පරිදි විධිමත්ව බදු දීමට නියමිතය.

(ඌ) මෙම අයවීම් ලබා ගැනීම සඳහා දැනටමත් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. නීතිපති දෙපාර්තමේන්තුව හා රු. 5000ට අඩු අය වීම් සම්බන්ධයෙන් සමඵ මණ්ඩළය වෙතද දන්වා ඇති අතරම අයකිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. දැනටමත් නිලධාරීන් දෙදෙනකු විසින් අදාළ මුදල් බැඳීමට කටයුතු කර ඇත.

- රසිට්පත් අංක HOR 0431
  ජී.ජී.පී මධුෂාන් (2186) 35,682
- රසිට්පත් අංක HOR 0431
  ඒ.එම්.ජමීල් (1222) 65,206.67

(ව) මීළඟට පැවැත්වෙන විගණන හා කළමණාකරණ රැස්වීමට යොමු කිරීමට කටයුතු කරමි.

(වී) වනරාජවත්ත ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බව එම ආයතනය විසින් යොමු කර තිබූ 2013.09.17,2016.01.12 සහ 2017.08.05 දිනැති ලිපි මඟින් තහවුරු කර ඇත. එබැවින් මෙම ඉඩම මිලදී ගැනීම සඳහා රු.9,280,000.00 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව වෙත ගෙවීම් කරන ලදි. ඒ අනුව මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අංක ක් අරසව් 307/2018 දරණ නඩුවක් වෙනත් පාර්ශවයක් විසින් පවරා ඇති බැවින් ඉඩමේ පවරා ගැනිම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත. එම නඩු තීන්දුව මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

(ඔ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන 06 ක පවත්වාගෙන යනු ලැබූ ළමා සුරැකුම් පාඨමාලාවල පුහුණුව ලබන ආධුනිකයින්ගේ පුහුණු කටයුතු වඩාත් ගුණාත්මකව ඉහළ පහසුකම් යටතේ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලෝක බැංකු ආධාර ඇතිව 2019.06.28 දින අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදි. එම අවබෝධතා ගිවිසුමට අනුව ළමා සුරකුම් පාඨමාලාව හදාරන ආධුනිකයෙකු වෙනුවෙන් අදියර 03 ක් යටතේ ලෝක බැංකු ආධාර මත රු .50,000.00 ක මුදලක මූල්‍යමය අනුග්‍රහය දක්වන ලදි.

2020 වර්ෂයේදී තවත් ළමා සුරකුම් පාඨමාලා 04 ක් මධ්‍යස්ථාන 04 ක ආරම්භ කිරීම සඳහා ඉඩ පහසුකම් සහ ඉල්ලූමක් පැවති බැවින් ඉහත මූල්‍යමය ආධාර යටතේ නව පාඨමාලා 04 ක් හඳුන්වා දී ඒ සඳහා උපකරණ මිළදී ගන්නා ලදි. ඒ අනුව ආධුනික සංඛ්‍යාව මාස 06 කට 80 බැගින් වැඩි වූ අතර එම ආධුනිකයින්ට සමානුපාතිකව පාඨමාලා සම්පූර්ණ කරන පිළිවෙලින් විටින් විට මූල්‍යමය ආධාර අප වෙත ලැබුණි. තවද ආරම්භ කර තිබූ සහ අළුතින් ආරම්භ කරනු ලැබූ සියළු ළමා සුරකුම් පාඨමාලා සඳහා හඳුනාගන්නා ලද සියළු උපකරණ මිළදී ගත් අතර ආරම්භ කරන ලද එම පාඨමාලාවල ආධුනික සංඛ්‍යාවට සමානුපාතිකව අවබෝධතා ගිවිසුමෙහි සඳහන් පරිදි වෘත්තීය පුහුණු අධිකාරිය වෙත මූල්‍යමය ආධාර ලැබුණි. ඒ අනුව අදාළ ළමා සුරකුම් පාඨමාලා සඳහා උපකරණ අවශ්‍යතා සැපයීමෙන් අනතුරුව පහත සඳහන් හේතු පාදක කොට අත්‍යවශ්‍යව පැවති පරිගණක 30 ක් මිළදී ගන්නා ලදි.

තවද 2019 වසරේදී තොරතුරු තාක්ෂණ ශිල්පී (NVQ Level IV) පාඨමාලා 10 ක් රැකියා වෙළඳපොළ වැඩි ඉල්ලූමක් පවතින පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී පාඨමාලා බවට පරිවර්තනය කරන ලද අතර ඒ සඳහා අවශ්‍යවන උපදේශක පුහුණුවීම සහ පංති කාමර සකස් කිරීම් ආදී අනෙකුත් සියළු අවශ්‍යතා ඉටු කළද භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමිත වූ බැවින් එම පාඨමාලා සඳහා අවශ්‍ය පරිගණක මිළදී ගැනීමට 2020 වර්ෂය තෙක් අවස්ථාව නොලැබුණි.

එමෙන්ම 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී පාඨමාලා 19 ක් සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් එම පාඨමාලා සඳහා අවශ්‍ය වන පරිගණක මිළදී ගැනීම සඳහා වූ ටෙන්ඩරය අවලංගු වීම මත නව පරිගණක මිළදී ගැනීමට අපොහොසත්වී ඇත.

2020 - 2021 වර්ෂයන්හි පැවති කොරෝනා වසංගත තත්ත්වය යටතේ ආධුනිකයින්ගේ පුහුණු කටයුතු වලට බාධා පැමිණීම හේතුවෙන් මෙම පාඨමාලාවන්හි පුහුණු කටයුතු දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය මඟින්ද උපදෙස් ලබා දී තිබූ අතර ඒ සඳහා ප්‍රමාණවත් තරම් ධාරිතාවයකින් යුත් නව පරිගණක නොමැති වීමෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇතිවී තිබුණි.

එබැවින් එම අවස්ථාවේදී ලෝක බැංකු ආධාර යටතේ ළමා සුරකුම් පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් 2019,2020 වර්ෂයන්හි වෘත්තීය පුහුණු අධිකාරියට ලැබුණු මුළු මුදල වන රු.25,699,700 කින් මිලියන 11 ක මුදලක් වැය කර පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී පාඨමාලා 10 සඳහා අත්‍යවශ්‍යව තිබූ පරිගණක 30 ක් මිළදී ගන්නා ලදි.

(ඕ) මෙම අයතනය කැබිනට් මණ්ඩළ අනුමැතියකින් තොරව පිහිටුවා ඇත. මෙම සමාගම මෙම අධිකාරියේ නිලධාරී මණ්ඩලයක් මගින් පාලනය නොවුනු බැවින් ගිණුම් ප්‍රකාශන / වත්කම් පිළිබඳ ලේඛණ ආයතනය සතුව නොමැත. විවිධ අවස්ථාවල මෙම ගැටළුව පැන නගින බැවින් හා සමාගම ඈවර කිරීමටද සමාග මේ ගනුදෙනු අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ සලකා මෙම සමාගම පිළිබඳව මූලික වාර්තාවක් ලබා දීමට කමිටුවක් දැනටමත් පත් කර ඇත. මෙම කමිටු වාර්තාව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවට හා ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිතය. 2022.06.20 දින මෙම සමාගම ඈවර කිරීමට අවශ්‍ය ලේඛණ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත බාර දී ඇත. මෙම ඈවර කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය විමසා දෙවන සිහිකැඳවීම් ලිපියද 2023.07.14 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

(ඖ) මෙම පුහුණු උපකරණ අයිතමයන්ද සපයා දීමට නොහැකි වී ඇත්තේ ආනයනික සීමා හේතුවෙන් බව අදාළ සැපයුම් ආයතන විසින් ලිඛිතව අධිකාරිය වෙත දැනුම් දී ඇත. තවද ඇතැම් සැපයුම්කරුවන් විසින් ලබා දුන් උපකරණ අවසන් තාක්ෂණික ඇගයීම් සමග පිරිවිතරයන්ට නොගැලපීම හේතුවෙන් එම අයිතම භාර නොගත් අතර එම සැපයුම්කරුවන්ට නිවැරදි පිරිවිතර මත භාණ්ඩ සපයන ලෙස දැක්වූ නමුත් රටෙහි පැවති ඩොලර් අර්බුදය මත එම උපකරණ ආනයන සීමා මත සැපයිය නොහැකි බව දන්වා ඇත. මේ වන විට එම භාණ්ඩ නැවත මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ඉල්ලා ඇත.



එයාර් වයිස් මාර්ෂල් ප්‍රසන්න රණසිංහ (විශ්‍රාමික)
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය